# 2018/04/04 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

මෙදින පෙ.වග 11.30 ට නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය -**

| | | |
|---|---|---|
| 1. | නිමල් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම් කේ ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ එච් වී අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ් ජී නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී වි සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 7. | එච් ජී තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච් කේ ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන් ජී ගයාන් මදුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රී |
| 14. | එඩේර ආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපේ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රී |
| 19. | එම්. එම්. දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන් ඩබ් පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ කේ අයි නේරංජලී මහත්මිය | ගරු මන්ත්‍රී |
| 23. | කේ ඒ සී දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 24. | එච් එච් ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 25. | ඩබ් කේ නෙලී මහත්මිය | ගරු මන්ත්‍රී |
| 26. | වී ජී අරුණ ශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 27. | පී ජී රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

ආගම සිහිකිරීමෙන් අනතුරුව රට දැය වෙනුවෙන් ජීවිතය පූජා කරමින් අපේ භෞතික අඛණ්ඩතාවය ආරක්ෂා කරපු රණවිරුවන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ඥාතී හිතයිෂීන්

තමන්ගේ මියගිය දේශපාලන නායකයින් ඒ වගේම සභාව නියෝජනය කරමින් අප හැර ගිය සභාපතිතුමන්ලා සහ සභා නියොජිතයින් සිහිපත් කිරීමට විනාඩියක නිශ්ශබ්දතාවයක් මම අපේක්ෂා කරනවා.

## 02. ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව

ආදරණීය, ගෞරවණීය සහෝදර අපේ මන්ත්‍රීතුමන්ලා මෙම ප්‍රාදේශීය සභාවේ නව සභාවාරයට මන්ත්‍රී මඩුල්ල ලෙස පත්වූ අපේ නියෝජ්‍ය සභාපති ගාමිණී සුසන්ත මැතිතුමනි, ඒ වගේම හිටපු සභාපති වර්තමාන මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මැතිතුමනි, අපේ හිටපු මන්ත්‍රී නිශාන්ත මන්ත්‍රීතුමනි, හිටපු සභාපති චන්ද්‍ර සහබන්දු මැතිතුමනි, හිටපු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මැතිතුමනි, හිටපු විපක්ෂනායක තරංග සුදර්ශන මැතිතමනි, හිටපු මන්ත්‍රී වසන්ත කුමාරගේ මැතිතුමනි, ලක්රුවන් සම්පත් මැතිතුමනි, ගයාන් මදුසංඛ මැතිතුමනි, ධර්මසිරි ගනේවත්ත මැතිතුමනි, පියල් හිරිමුතුගොඩ මැතිතුමනි, සුභාෂි මධුමාලි මැතිනියනි, වෙරංග ලක්මාල් මැතිතුමනි, සමන් මැතිතුමනි සී වනිගරත්න මැතිතුමනි, අමර ධනංජය මැතිතුමනි, ප්‍රියන්තා ගුණසේකර මැතිතුමනි, දිසානායක මැතිතුමනි, පතිනායක මැතිතුමනි, විජිත් වීරගුණරත්න සහබන්දු මැතිතුමනි, නේරංජලී මැතිනියනි, සී දිල්රුක්ෂි මැතිනියනි, ගයන්ති කුමාරි මැතිනියනි, නෙලී මැතිනියනි, අරුණ ශාන්ති මැතිනියනි, රංජිත් ජයවීර මැතිතුමා ඇතුළු අපේ ලේකම්තුමිය, අපේ නිලධාරිතුමිය ඇතුළු සියළු දෙනාගෙන්ම අවසරයි. පළමුවෙන්ම මම ගෞරවණිය ස්තූතිය පුද කරනවා අපේ හිටපු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 5 ස් වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට. එතුමාගේ ආදර්ශමත් දේශපාලන දර්ශනය අපි ඉදිරියට ගෙන යන්නේ. අද තමයි මන්ත්‍රීතුමියන්ලා හැටියට මුලින්ම දැක්කේ ඒ නිසා තමයි නම් අමතක වුනේ, අපට අද දිනය අපේ සභාවට විශේෂ වූ දිනයක් නාගොඩ ප්‍රාදේශීය සභාව ගම් සභාවක් ලෙස නාගොඩ ප්‍රාදේශීය සභාව බවට පත්වුනාට පසුව නියෝජිතයින් 13 කින් සමන්විත මන්ත්‍රී මණ්ඩලයක් තමයි මේ සභාවෙ හිටියේ, එවකට මෙම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ධුරය දරමින් සිටියේ වර්තමාන අමාත්‍ය ධුරය දරණ යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා, වර්තමාන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරය දරන විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා ඒ වගේම වර්තමාන මන්ත්‍රීවරු ලෙස සිටින චන්ද්‍රා සහබන්දු මැතිතුමා, අජිත් එඩේරආරච්චි මැතිතුමා, පසුගියදා අප අතරින් වෙන්වූ විලේගේ හේමචන්ද්‍ර මැතිතුමා, ප්‍රාදේශීය සභා සභාපතිවරු වශයෙන් මෙම ප්‍රාදේශීය සභාවට මහගු සේවයක් කල බව අ පිළිගත යුතුයි ඒ අනුව එම කාල වකවානුව තුල අප ආ ගමන්මග තුළ මෙවර මේ ප්‍රාදේශීය සභාවේ දේශපාලන ක්‍රමවේදය තුල පක්ෂ දේශපාලනය තුල අප මෙවර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යටතේ තරග කරලා කොට්ඨාශ 15 ක් ජයග්‍රහණය කර බලය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ලැබුණු අතර, ඒ ක්‍රමය තුළ අප සමග තරග කළේ එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික නිදහස් පෙරමුණ, එක්සත් ජාතික නිදහස් සන්ධානයයි මෙම ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ඇතිවන තත්වයකි ඒ තත්වය තුළ අප කොට්ඨාශ 15 ට නියෝජිතයින් 15 ක් තොරා ගත්තා. ඒ අනුව අපට ලැබුණා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් පොහොට්ටුව යටතේ තරග කළ 15 දෙනාම දිනුවා. නමුත් මේ ක්‍රමය තුළ කවුරුත් නියොජනය විය යුතු නිසා එක්සත් ජාතික පක්ෂයෙන් නියෝජිතයන් 07 කුත්, බුලත් කොළයෙන් 03 කුත්, කෙසෙල් ඇවරියෙන් හා ජනතා විමුක්ති පෙරමුණ යටතේ 01 අයකු බැගින්ද තෝරා පත් කර ගත හැකි වුනා. අපි කලින් කිව්ව 13 දෙනා මෙම ක්‍රමය තුළ 27 දෙනෙක් බවට පත් වුණා. නාගොඩ ප්‍රාදේශීය සභාව කුඩා වුවත් මෙම ක්‍රමය මුළු ලංකාවට පොදු ක්‍රමයක් නිසා අප සභාවටත් එය අදාල වුනා. බහුතර බලය පොහොට්ටුවට ලැබුනු නිසා ඒ පොහොට්ටු වේ කණ්ඩායමේ සභාපති හැටියට මුළු මන්ත්‍රීවරු 27 අතරින් නිමල් වික්ටර් නාගොඩවිතාන වන මා හට පත්වීමට හැකියාව ලැබුණා. ඒ ගැන මට සතුටුවෙන්න පුළුවන් මම සතුටුවන්නේ මගේ මේ සභාපතිකම ඔටුන්නක් කර ගෙන මට ඒකෙන් බැබලෙන්න නොමෙයි මම විසින් ඒ ඔටුන්න බැබලුවොත් තමයි මට සතුටු වෙන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මන්ත්‍රීවරුන් 27 දෙනාම මට සහෝදර, සහෝදරියන් වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම විශේෂයක්

නොවන්න කටයුතු කරනවා. අපට හිටපු සභාපතිවරු දෙදෙනෙක් ඉන්නවා. කාන්තා මුහුණු 07 ක් ඉන්නවා. හිටපු මන්ත්‍රීවරු ඉන්නවා. අපට සතුටු වෙන්න පුළුවනී ලාබාල වයස් සීමාවක පසුවන අයත් ඉන්නවා. ඒ අය දේශපාලනය ගැන කිසිම දෙයක් නොදන්නවා වෙන්න පුළුවන් නමුත් අපිත් මේ ප්‍රාදේශීය සභාවට එන විට දේශපාලනය ගැන කිසිම දෙයක් දන්නෙ නැහැ. මෙහි ප්‍රසිද්ධ දේශපාලන ක්‍රියාකාරීන් ඉන්නවා. අපේ ගාමිණී සුසන්ත මහත්තයා, අජිත් මහත්තයා වගේ ඔවුන් දන්නවා දෙයක් ඔවුන්ගෙන් අපට ඉගෙන ගන්න පුළුවන්. අද අපි මෙම සභාවෙ වාඩිවෙලා සිටින්නෙ පෙර ආකාරයට නොමෙයි නමුත් අපේ නීති රීති වලට අනුව ඉඩ පහසුකම් අඩු වුනත් අපට සතුටුයි මේ 27 දෙනා වාඩි වී සිටින ක්‍රමවේදය ගැන මෙතුමන්ලා මහන්සිවෙලා හදපු එක ගැන වෙනදා පක්ෂ විපක්ෂ වශයෙන් වාඩිවෙනවා. නමුත් අද එහෙම දෙයක් නැහ. අද සියළු දෙනාම එකට එකතු වෙලා කටයුතු කරනවා. මම විශේෂයෙන් කියන්න ඕන මට ඔය සියළු දෙනාම සහෝදරයෝ කියලා හිතන්න. ඔයාල මට උපරිම සහය දක්වන්න. ඒ දැක්වීම තුළ අපට එකා මෙන් වැඩ කරන්න පුළුවන්. අපි ආවෙ අපේ බලය පෙන්නනන නොවෙයි. අපි ආවෙ මිනිසුන්ට සේවය කරන්න. අපිට සේවය කරගන්න නොවෙයි අපි මිනිසුන්ට සේවය කරහම ඉබේම අපට සේවයක් වෙනවා. අපි සියළු දෙනාම හිතට ධාරණය කර ගන්න අපි ආවෙ අපේ රටට, ගමට සේවයක් කර ගන්න. අපි අලුත් ප්‍රාදේශීය සභාවේ මංගල සභාවට මතිමතාන්තර මොනවා තිබුනත්, දුරකතනයෙන් මම මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුට ආරාධනා කළා. සහ යම් යම් ක්‍රමයන්වලින් විවිධ මතිමතාන්තර නිසා එයාලා සහභාගි වුනේ නැහැ.මට විරුද්ධව නෙවෙයි මම ඒ ගැන කිසි අහිතක් හිතන්නෙ නැහැ.

අපේ ගරු නියොජ්‍ය සභාපතිතුමා ගාමිණී සුසන්ත මැතිතුමා මට වඩා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමෙක්. 1997 මෙම ප්‍රාදේශීය සභාවට ආවේ එතුමා තමයි මගේ නියෝජ්‍ය සභාපති වුනේ අපි දෙන්නා තමයි සභාපති වන්නේ අපි කවුරුත් සභාපති වගේ තමයි අජිත් මහත්තයා, නන්දන මහත්තයා, සහබන්දු මහත්තයා ඉන්නවා අපි එතුමන්ලාගේ අදහස් උදහස් ගන්න ආසයි. අපි සියල්ල දත්තො නොවෙයි නැවතත් මම සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මට හැමෝම උදව් කරන්න කියලා. මගෙනුත් උදව් ගන්න කියලා. අපි වචනෙට සීමා වුන අය නොවෙයි මම ආවෙ දෑත් පිරිසිදුව වැඩක් කරන්න ඒ වැඩ කරන්න සහය දුන්නොත් මට පුළුවන් මගේ උපරිම දායකත්වය ඔබට ලබා දෙන්න. අපේ සභාවේ ආර්ථික තත්වය බොහොම දුර්වලයි නමුත් අපේ ලේකම්තුමිය අවුරුදු 03 ක් පුරාවට එවැනි තත්වයක් තුල කල යුතු දේ සිදු කළා. යම් මෙහෙයක් සිදු කළා. ඒ ගැන අපි එතුමියව මේ අවස්ථාවේදී සිහිපත් කල යුතුයි. කල යුතු දේ වචනයක් නොඅහන්න එතුමිය කළා. ඇත්තටම ඉඩ පහසුකම් නොමැතිව මෙලෙස සභාවක් තැබීමට සංවිධානය කිරීම ගැන කාර්ය මණ්ඩලය ඇතුළු ඔබතුමියට මම ගෞරව කරනවා. අපේ ඇමතිතුමා කියලා තිබුනෙ හිටගෙන ඉන්න කියලා අපට පුදුමයි මේ 27 දෙනා අසුන් ගනිපු විදියට ඒ වගේම අපේ ආරාධනය පිළිගෙන. අපිට අඩුපාඩු තිබුනත් මෙම අවස්ථාවට පැමිණි අපේ උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්, හිටපු සභාපතිවරුන් අලුත් මන්ත්‍රීතුමියන්ලා සියළුම දෙනාම ඉතාම ගෞරවයෙන් පිළිගනිමින් මම පිළිගැනීමේ කතාව අවසන් කරනවා. සියළු දෙනාටම ජය වේවා.

**03. සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

01. සියළුම මන්ත්‍රීවරුන් වෙත ප්‍රකාශ ලබා දෙන අතර එම වත්කම් බැරකම් ප්‍රකාශ ඊළග සභා වාරයේදී ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

02. දිවිරුම් ප්‍රකාශ ලබා නොදුන් සියළුම මන්ත්‍රීවරුන් දිවිරුම් ප්‍රකාශ ඉතා කඩිනමින් ලබා දෙන ලෙස දැනුම් දෙමි.

03. සියළුම මන්ත්‍රීවරුන්ට නිල මුද්‍රාවක් ලබා දෙන අතර ඊට අදාළ ඉල්ලීම් ලිපි ලබා දීමට කටයුතු කරනමෙන් දන්වා සිටිමි.

**04. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන**

I. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අංක දපපා/පරිනි/චක්‍රලේඛ හා 2018.02.22 දිනැති පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩලය අභ්‍යන්තර ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම සම්බන්ධව ලිපියට අනුව ස්ථාන මාරු හා අනුයුක්ත කිරීමට පළාත් පාලන කොමසාරිස් යටතේ සිදු කල යුතු බව හා එසේ අවශ්‍ය වන විට අවශ්‍යතාවය පිළිබද වාර්තාවක් ඉදිරිපත් කර ඊට අවශ්‍ය අනුමැතියද කොමසාරිස්තුමාගෙන් ලබා ගත යුතු බව දැනුම් දුනි.

තවද තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, දෛනික, සහන හෝ වෙනත් කිසිදු පදනමක් මත පත්වීම ලබා දීම හා සේවයේ යොදවා ගැනීමට කටයුතු නොකල යුතු බවත්, සේවා අවශ්‍යතාවය මත එසේ පත්වීමක් ලබා දීමට අවශ්‍ය නම් සාධාරණීකරණ වාර්තාවක් ඉදිරිපත් කර පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගත යුතු බව එම ලිපිය මගින් වැඩිදුරටත් දක්වා ඇති බව තහවුරු විය.

II. පළාත් පාලන දෙපාර්තමේන්තුව අංක 03/02/01-2018 හා 2018.03.22 දිනැති ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කොම්පෝස්ට් බදුන් මිළදී ගැනීම සම්බන්ධව ලිපියට අනුව පළාත් පාලන ආයතනය වෙත රැස්වන දිරණ කසල ප්‍රමාණය අවම කිරීමේ අරමුණින් සහනදායි මිළ ගණන් යටතේ සිලින්ඩරාකාර පතුල සහිත බදුන් 50 ක් හා කේතු ආකාර පතුල රහිත බදුන් 50 ක් සහනදායි මිළ වන රු. 1250.00 කට ලබා දෙන බව දන්වා ඇති අතර ගෙවතු වගා කරන්නන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් අදාළ කොට්ඨාශයන්ට අදාළ නිවාසවල නම ලිපිනය 2018.02.09 දිනට පෙර ලබා දෙන ලෙස දන්වන ලිපිය කියවන ලදී.

**05) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**05) යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. මහ සභාව පැවැත්වෙන දිනවලදී පැමිණෙන ගරු මන්ත්‍රී මණ්ඩලය සඳහා උදේ තේ ලබා දීම, දහවල් ආහාර ලබා දීම සහ සවස තේ ලබා දීම සඳහා අවශ්‍ය වන මුදල් සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.
සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව සම්බන්ධව සභාවේ එකගතාවය විමසා සිටියේය. එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

ii. සේවයේ අවශ්‍යතාවය මත දෛනික රාජකාරිවලට අමතරව අතිකාල සේවයේ යෙදීම වෙනුවෙන් ස්ථිර හා අනියම් සේවකයන්ගේ අතිකාල ගෙවීම සඳහා අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

සේවයේ අවශ්‍යතාවය මත අතිකාල දීමනා ඉල්ලා සිටීමේ ලිපිය සම්බන්ධව මුර සේවයේ සහ නිලධාරීන්ගේ අවශ්‍යතාවය මත රාජකාරියේ යෙදීම වෙනුවෙන් අතිකාල ලබා දීමට අනුමැතිය ලබා දෙන බව පවසමින් අජිත් එඩේරආරච්චි මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී.

සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව සම්බන්ධව සභාවේ එකගතාවය විමසා සිටියේය. එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

iii. PF 7360 කැබ් රථයට සහ 252-6478 කැබ් රථ දෙක සදහා මසකට වැය කල හැකි ඉන්ධන ප්‍රමාණය අනුමත කර ගැනීම

සභාවේ ඩීසල් අනුමත කර ගැනීම පිළිබදව සාකච්ඡා වූ අතර ලීටර් ගණන අනුමත කල යුතු බැවින් ඒ සදහා අනුමැතිය ලබා දීම පිළිබදව ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේය. මෙහිදී 252-6478 කැබ් රථයට ලීටර් 400 ක් හා PF 7360 කැබ් රථයට ලීටර් 600 ක් අනුමත කිරීමට ඉල්ලා සිටියේය. ඒ අනුව සභාපතිතුමා භාවිතා කරන අංක PF 7360 කැබ් රථය සදහා ලීටර් 600 ක ඉන්ධන දීමනාව චන්ද්‍රා සහබන්දු මන්ත්‍රීතුමා අනුමත කල අතර අනෙක් පැරණි 252-6478 කැබ් රථය සදහා ඉන්ධන ප්‍රමාණය තීරණය කිරීමට මාසිකව එම වාහනය භාවිතා කිරීමෙන් සම්බන්ධ මාසික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අතර එම වාර්තාව සළකා බලා 252-6478 කැබ් රථයේ ඉන්ධන ප්‍රමාණය අනුමත කරන බව එතුමා පැවසීය. ඒ සම්බන්ධව නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා සහ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමාද එකගතාවය පළ කලේය.

නමුත් පරණ කැබ් රථය සදහා ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා යෝජනා කල ලීටර් 400 ක සීමාව අනුමැතිය ලක්රුවන් මන්ත්‍රීතුමා ස්ථිර කලද චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා ඊට විරුද්ධ වෙමින් කියා සිටියේ පරණ කැබ් රථයේ ඉන්ධන දහනය වන මාසික වාර්තාව සලකා බලා ඉදිරියේදී එය තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසයි.

තරංග සුදර්ශන මන්ත්‍රීතුමාද ප්‍රකාශ කර සිටියේ සභාපති නිල රථයට පමණක් ඩීසල් අනුමත කරන බවත්, අනෙක් වාහන සදහා සේවයේ අවශ්‍යතාවය මත රාජකාරි ඉටු කරන තර එම අනෙක් වාහන සදහා සභාව මගින් ඩීසල් සීමාව පැනවීම අවශ්‍ය නොවන බවත්ය.

මෙහිදී සේවා අවශ්‍යතාවය මත ආයතනයේ කාර්ය මණ්ඩලය උදෙසා වාහනවල ඩීසල් අනුමත කිරීමට විරුද්ධත්වයක් නොමැති බව අජිත් මහතාද ප්‍රකාශ කර සිටියේය.

සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව සම්බන්ධව සභාවේ එකගතාවය විමසා සිටියේය. එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**වෙනත් යෝජනා**

- ❖ මන්ත්‍රීවරුන්ගේ මාසික දීමනාව තවම ප්‍රතිපූර්ණය වී නොමැති නිසාත්, කිසිදු සභාවක තවමත් නොදී ඇති නිසාත්, මන්ත්‍රී වැටුප් ගෙවීම ගැටළු සහගත වුවත් ඉදිරියේදී එලඹෙන සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් අවශ්‍යතාවය මත සභා අරමුදලින් මන්ත්‍රී වැටුප් ගෙවීමට සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

- ❖ සභාව පවත්වනු ලබන ශාලාව පුළුල් කිරීම සඳහා  සභාවේ පිටුපස බිත්තිය තබා එම කටයුත්ත ඉතා කඩිනමින් එනම් ඊළඟ සභා වාරයට පෙර සිදු කර ගැනීම පිළිබඳව අජිත් එඩේරආරච්චි මහතා යෝජනා කල අතර සභාව පවත්වනු ලබන ශාලාව AC කර දීම සම්බන්ධව ද චන්ද්‍රා සහබන්දු මහතා වැඩිදුරටත් යෝජනා කලේය.
මෙහිදී එළඹෙන සිංහල අලුත් අවුරුද්ද නිසා එම කටයුතු කඩිනමින් සිදු කිරීම අපහසු බවත් ඉදිරි කාලයේදී එම කටයුතු සිදු කිරීමට කටයුතු කරන බවත් පවසා සිටියේය.

## 07. කමිටු පත් කිරීම

### I. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව

මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට පළමුවෙන්ම ගරු සභාපතිතුමා, ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා, සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමිය, ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය ගේ නම් යෝජනා විය.

මෙහිදී චන්ද්‍රා සහබන්දු මහතා විසින් කමිටු සාමාජිකයින් පත් කිරීමේදී විවිධ පක්ෂ නියෝජනය වන ලෙස කමිටු සාමාජිකයින් පත් කල යුතු බව ප්‍රකාශ කළේය. ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඔබතුමාලා පාලක පක්ෂය හැටියට සභාපතිතුමා ඇතුළු තුන්දෙනෙකුත්, අනෙක් ප්‍රතිපක්ෂ වලට 02 ක් පත් කරන්න ඉඩ දෙන්න යනුවෙන් පැවසූ අතර මුදල් කමිටුව සම්මත කල යුත්තේ මහසභාවේ අනුමැතියට යටත් විය යුතු බවත් ප්‍රකාශ කළේය. අවසාන වශයෙන් කමිටුව ගන්නා තීරණය වැරදි නම් සභාව සම්මත කරන්නේ නැහැ. ඒ නිසා අපි යෝජනා කරනවා ගරු සභාපතිතුමාට ඒ පැත්තෙන් 03 දෙනෙක් පත් කරන්න. අනිත් පක්ෂ දෙකෙන් දෙන්නෙක් පත් කරන්න කියලා අපි ආරාධනා කරනවා. එක් කමිටුවකට එක් පක්ෂයකින් විතරක් පත්කලොත් අනිත් කමිටුවලට ඒ පක්ෂයෙන් පත් කරන්න නැති වෙයි. අපි හැමෝම නියොජනය වන පරිදි බැලන්ස් කරගෙන පත් කරමු. මෙහිදී එය අනුමත කරමින් අජිත් මහතාද ඊට එකග විය. එමෙන්ම අලුත් මන්ත්‍රීවරුනුත් කමිටු සාමාජිකයන් ලෙස පත් කිරීමට සහබන්දු මහතා යෝජනා කලේය.

දැන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිල බලයෙන් සභාපතිතුමා ඉන්නවා. තව තුන් දෙනෙක් පත් කරන්න

එහිදී අජිත් මහතා විසින් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා එම කමිටුව සඳහා යෝජනා කල අතර එහිදී ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා තම අදහස් ප්‍රකාශ කරමින් මාහට එම මුදල් කමිටුවේ කටයුතු කිරීම අපහසු බවත්, අනෙක් කමිටුවලට සහභාගී වන බවත් පැවසූහ.

ඒ අනුව පියල් හිරිමුතුගොඩ මන්ත්‍රීතුමාගේ හා ගයාන් මධුෂංක මන්ත්‍රීතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් පත්වූ සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙන් ඉල්ලා අස්වූ අතර අනෙක් සාමාජිකයින් වන ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා, හා ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය මුදල් හා ප්‍රතිපත්ති කමිටු සාමාජිකයන් ලෙස පත්විය.

නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා විසින් කමිටු සාමාජික ලෙස තරංග සුදර්ශන මන්ත්‍රීතුමා යෝජනා කරන ලදී. අනෙක් කමිටු සාමාජික ලෙස අජිත් එඩේරආරච්චි මහතා සුදුසු බව තරංග සුදර්ශන මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කමිටු සාමාජිකයන් වශයෙන්, පහත නම් සඳහන් කමිටු මණ්ඩලය තේරී පත් විය.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා,
ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය
තරංග සුදර්ශන මන්ත්‍රීතුමා
අජිත් එඩ්රිරආරච්චි මන්ත්‍රීතුමා

### II. නිවස හා ප්‍රජා සංවර්ධන කමිටුව

මෙහිදී නැගී සිටි විජිත් සහබන්දු මන්ත්‍රීතුමා විසින් ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමාත්, වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමාත්, සමන් විතානගේ මන්ත්‍රීතුමාත්, සුදුසු යැයි යෝජනා කලේය. ඊට අමතරව රංජිත් ජයවීර මන්ත්‍රීතුමා විසින් අරුණ ශාන්ති මන්ත්‍රීතුමියත්, අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය විසින් රංජිත් ජයවීර මන්ත්‍රීතුමාත් සුදුසු යැයි යෝජනා කලේය. ඉහත සිදු කරන ලද සියළුම මන්ත්‍රීවරුන්ගේ යෝජනා ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු සාමාජිකයන් ලෙස තොරා පත් කර ගන්නා ලද මණ්ඩලය පහත පරිදි වේ.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ගාමිණී සුසන්ත මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය

### III. කාර්මික සේවා කමිටුව

මීලගට කාර්මික සේවා කමිටුව පත් කර ගැනීමේ අවස්ථාවේදී, නැගී සිටි ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය විසින් ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමාත්, පියල් හිරිමුතුගොඩ මන්ත්‍රීතුමාත්, එම්. එම්. දිසානායක මන්ත්‍රීතුමාත් සුදුසු යැයි යෝජනා කළාය. තවද තරංග සුදර්ශන මන්ත්‍රීතුමා විසින් වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා යෝජනා කල අතර, වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා විසින් ඉනෝකා විජේවර්ධන මන්ත්‍රීතුමිය යෝජනා කරන ලදී. ඉහත සියළුම මන්ත්‍රීවරුන්ගේ නම් එන්. වී. සමන් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව කාර්මික සේවා කමිටු සාමාජිකයන් ලෙස තොරා පත් කර ගන්නා ලද මණ්ඩලය පහත පරිදි වේ.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
ගරු මන්ත්‍රී එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය

### IV. පරිසර කමිටුව

මෙහිදී පරිසර කමිටු සාමාජිකයින් ලෙස චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමා, විජිත් සහබන්දු මන්ත්‍රීතුමාත්, සුභාෂී ඒකනායක මන්ත්‍රීතුමියත්, සුදුසු යැයි ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලද අතර අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය විසින් රංජත් ජයවීර මන්ත්‍රීතුමා සහ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා සුදුසු යැයි යෝජනා කරන ලදී. ඉහත සියළුම මන්ත්‍රීවරුන්ගේ නම් අමර විලේගේ මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව පරිසර කමිටු සාමාජිකයන් ලෙස තොරා පත් කර ගන්නා ලද මණ්ඩලය පහත පරිදි වේ.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති

ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මහතා
ගරු මන්ත්‍රී රංජත් ජයවීර මහතා
ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා
මහජන සෞඛ්‍ය පරීක්ෂක (කොට්ඨාශයට අදාළ)
මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරී

## V. ටෙන්ඩර් කමිටුව

ටෙන්ඩර් කමිටුව සදහා ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමාත්, ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමාත්, එම්. එම්. දිසානායක මන්ත්‍රීතුමාත්, සුදුසු යැයි සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමිය යෝජනා කළාය. තවද, චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා සහ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා සුදුසු යැයි වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා යෝජනා කල අතර එම සියළුම යෝජනාවන් එන්. වී. සමන් මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ටෙන්ඩර් කමිටු සාමාජිකයන් ලෙස තොරා පත් කර ගන්නා ලද මණ්ඩලය පහත පරිදි වේ.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

## VI.තාක්ෂණ ඇගයුම් කමිටුව

එමෙන්ම තාක්ෂණ කමිටුව සදහා සමන් විතානගේ මන්ත්‍රීතුමා, ගයාන් මධුෂංක මන්ත්‍රීතුමා, වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමා සුදුසු යැයි ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා යෝජනා කලේය. තවද, ගයාත්‍රි කුමාරි මන්ත්‍රීතුමිය සහ තරංග සුදර්ශන මන්ත්‍රීතුමා සුදුසු යැයි වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා විසින් යෝජනා කල අතර විජිත් සහබන්දු මන්ත්‍රීතුමා විසින් ඒ සියළුම යෝජනා ස්ථිර කරන ලදී.

ඒ අනුව තාක්‍ෂණ ඇගයුම් කමිටු සාමාජිකයන් ලෙස තොරා පත් කර ගන්නා ලද මණ්ඩලය පහත පරිදි වේ.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී ගයාන් මධුෂංක මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රිනී ගයාත්‍රි කුමාරි මහත්මිය
ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා
කමිටුවට ක්ෂේත්‍රය පිළිබඳ තාක්ෂණික දැනුමක් ඇති පුද්ගලයන්ද බාහිර ආයතනවලින් සොයාගෙන කමිටුවට පත් කර ගත යුතු බව සඳහන් විය.

## VII. පුස්තකාල උපදේශන කමිටුව

පුස්තකාල උපදේශන කමිටුව සඳහා ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමියත්, සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමියත්, ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමාත් සුදුසු යැයි වෙරංග ලක්මාල් මන්ත්‍රීතුමා යෝජනා කල අතර, කේ. ඒ. චන්දිමා දිල්රුක්ෂි මන්ත්‍රීතුමිය හා නෙලී මන්ත්‍රීතුමියත් සුදුසු යැයිද යෝජනා වූ අතර එම යෝජනා සියල්ලම චන්ද්‍රා සහබන්දු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරනු ලැබීය.

ඒ අනුව පුස්තකාල උපදේශන කමිටු සාමාජිකයන් ලෙස තොරා පත් කර ගන්නා ලද මණ්ඩලය පහත පරිදි වේ.

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහත්මිය
ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රිනී කේ. ඒ. චන්දිමා දිල්රුක්ෂි මහත්මිය
ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

## 08. චෙක්පත් අත්සන් කිරීම සඳහා බලතල පැවරීම

මෙහිදී දැනට පළමු අත්සන යොදන එම්. එච්. ෆර්සියා ෆර්වින් ලේකම්තුමිය හා දෙවන අත්සන යොදන කළමනාකරණ සහකාර හංසිකා හේවාවිතාන මෙනවියත් චෙක්පත් අත්සන් කිරීමට සුදුසු යැයි සභාපතිතුමා විසින් යෝජනා කල අතර නෙලී මන්ත්‍රීතුමිය විසින් එය ස්ථිර කළාය.

## 09. මුදල් කමිටුව වෙත බලතල පැවරීම

ඒ අනුව මුදල් කමිටුවේ අනුමත නම් මහ සභාවට යටත්ව එම ගෙවීම සිදු කිරීමට අනුමැතිය ලැබෙන බවට නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා යෝජනා කල අතර වසන්ත කුමාරගේ මහතා එම යෝජනාව ස්ථිර කලේය.

## 10. සභා රැස්වීම් පැවැත්වෙන දිනය තීරණය කිරීම

මීළගට මාසික සභා රැස්වීම් පවත්වන දිනය පිළිබඳව සාකච්ජා කල අතර මෙහිදී ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා එම පැවැත්විය යුතු දිනය සම්බන්ධව ප්‍රකාශයක් සිදු කලේය. මෙහිදී මාසික රැස්වීම් පැවැත්විය යුත්තේ තවත් අතුරු රැස්වීමක්, විශේෂ රැස්වීමක් පැවැත්වීමට හා සෑම මසකම දැනුම් දීම කල යුත්තේ වැඩ කරන දින 07 ක් ඇතුලත බැවිනුත් සෑම මසකම දෙවැනි සතියේ අගහරුවාදා දින ඊට වඩා සුදුසු යැයි එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.වෙනදා නම් අපි බ්‍රහස්පතින්දා හෝ බදාදා දින තමයි දාගත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් වැඩි වශයෙන් සිටින නිසා තමයි ඒ වගේ දිනයක් දාගත්තේ වැඩිදුරටත් සාකච්ඡා කර මාසික සභා රැස්වීම සෑම මසකම දෙවැනි සතියේ අගහරුවාදා දින තැබීමට එකග විය.

**11. කාරක සභා වාර්තාව**

නැත.

**12. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම**

ඉදිරියට කල් තබන ලදී.

13. **වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීම**

මෙහිදී අද පළමුවතාවට මේ සභාවට ආපු මන්ත්‍රීතුමියත් හා මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. ඊට අමතරව හිටපු සභාපතිවරු ඉන්නවා. ඔවුන් සියළුදෙනාම වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමට මම ආරාධනා කරන ගමන්ම මුලින්ම අපේ උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිවරුනි, මේ අවස්ථාවට සම්බන්ධ වී සිටින ජනමාධ්‍යවේදී මහත්වරුනි, ලේකම්තුමනි, අනිකුත් නිලධාරිවරුන්ගෙන් අවසරයි. නව සැසිවාරයක් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ආරම්භ කල මේ මොහොතේ වෙනත් කරුණු යටතේ මට මුලින්ම අවස්ථාව ලබා දීම සම්බන්ධව මම පළමුවෙන්ම ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. මම මෙය අවස්ථාවක් කර ගන්නවා සභාවට පත්වුණු සියළුම මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ට සුභ පැතීම සඳහා මුලින්ම මම සිහිපත් කරන්න කැමතියි අපේ ගරු සභාපතිතුමා ප්‍රාදේශීය සභා කාලය තුළ හොද අත්දැකීම් ඇති ඒ වගේම ප්‍රාදේශීය සභා කිහිපයක්ම නියෝජනය ලබමින් ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාව හැමවෙලේම ඉහළ තලයකට ගෙන ඒම සඳහා උත්සාහ දරපු අයෙක්. හැම ප්‍රාදේශීය සභාවකම ගොඩක් කරුණු කාරනා කතා කරන ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමා මෙම ප්‍රාදේශීය සභාවේ අතීතයේ හිටපු සභාපතිවරුන්ට සහයෝගය දක්වමින් උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන්ට සහයෝගය දක්වමින් මේ ප්‍රාදේශීය සභාවේ දියුණුවට කටයුතු කල අප ප්‍රදේශයේ අද සිටිනා ප්‍රධාන පුරවැසියා වශයෙන් අපි ඔබතුමාව අගය කරනවා. ඒ වගේම සුභ පතනවා. මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා නම් ගම් කියන්න මම විශේෂයෙන් මෙය අවස්ථාවක් කර ගන්නේ නැහැ. නමුත් මම ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරු 8 දෙනෙක් විශේෂයෙන් සිහිපත් කල යුතු වෙනවා. අපේ අජිත් එඩිරආරච්චි මැතිතුමා , චන්ද්‍ර සහබන්දු මැතිතුමා හිටපු සභාපතිවරුන් වශයෙනුත්, තරංග සුදර්ශන මැතිතුමා, නිශාන්ත නන්දන මැතිතුමා, වසන්ත කුමාරගේ මැතිතුමා, බන්දුල හිරිමුතුගොඩ මැතිතුමා, එම්. එම්. දිසානායක මැතිතුමා, ලක්රුවන් සම්පත් මැතිතුමා, චන්ද්‍රසිරි වනිගරත්න මැතිතුමා හිටපු මන්ත්‍රීවරුන්

වශයෙනුත් නැවත නැවතත් ප්‍රදේශයේ ජනතාවගේ හිත දිනා ගනිමින් ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරමින් සභාව නියෝජනය කිරීම පිළිබඳව මම සිහිපත් කරන්න කැමතියි.

අද මේ සභාව නියෝජනය කිරීමට සම්බන්ධ වූ සියලු නවක මන්ත්‍රීවරුන් මන්ත්‍රීතුමියන් ඔවුන් නවකයි කියලා හැඳින්වූවට ප්‍රශ්ණයක් කර ගන්න එපා. අපි දන්නවා ඔබතුමන්ලා ගමේ ස්වේච්ඡා සංවිධාන, මරණාධාර සමිතියේ ඉඳන්ම පොදු කටයුතු සිදු කරමින් ගමේ ජනතාවගේ කටයුතුවලදී දුකේදීත්, සැපේදීත් තමන්ගේ වර්ගයා නියෝජනය කරමින් කටයුතු කරපු නිසා තමයි අද තමුන්නාන්සේලා මේ සභාවට තේරී පත් වෙලා ඇවිත් තියෙන්නෙ. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාව අලුත්ම මැතිවරණ ක්‍රමයකට ආරම්භ වුණා. අපි කොට්ඨාශ 15 ක් යටතේ 15 දෙනෙක්ව මෙම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ගමන්ම සමානුපාතික ලයිස්තු ක්‍රමය යටතේ තවත් 12 දෙනෙක් මෙම අවස්ථාවේදී ගරු සභාව නියෝජනය කරනවා. ඒ වගේම කොට්ඨාශයෙන් තරග කරලා පත් වුන් හා සමානුපාතිකව පත්වෙලා අද මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් අතර කිසිම වෙනසක් නැහැ. අපි කවුරුත් මේ ප්‍රාදේශීය සභාවේ සභිකයින්, ගරු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් ඒ නිසා අපි විශේෂයෙන්ම මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව කරුණු කාරනා මේ සභාව හමුවේ කියන්න අපි කැමති නැහැ. නමුත්, ගරු චන්ද්‍රා සහබන්දු මැතිතුමනි, අජිත් එඩේරආරච්චි මැතිතුමනි, තරංග සුදර්ශන මැතිතුමනි, නිශාන්ත නන්දන මැතිතුමනි, ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරුනි, අපේ මැතිවරණ ක්‍රමය ගැන අප කතා කල යුතු වෙනවා නමුත් දැන් අපි එය කතා කරන්නේ නැහැ. අපි මැතිවරණ ක්‍රමය ගැන කතාකලොත් පමණයි අපේ අදහස් හා යෝජනා අඩුම තරමේ පුවත්පතකවත් පළ වෙන්නේ, නැතිනම් මේ රට පාලනය කරන අඩුම තරමේ පළාත් පාලන අමාත්‍යවරයා ඇතුළු මේ ක්‍රියාදාමයට සම්බන්ධ වුනු සියළුම දෙනාට අපේ අදහස් හා යෝජනා ඉතා වැදගත් වෙනවා ඉදිරියේදී මෙම පළාත් පාලන මැතිවරණ ක්‍රමය යටතේ පවතින විෂමතා හා අඩුපාඩුකම් ඉවත් කර ගැනීමට මේ සම්බන්ධව කතා කල යුතු වන්නේ අපි තමයි. පාර්ලිමේන්තු හෝ පළාත් සභාවේ මන්ත්‍රීවරු නෙවෙයි. සභාව නියෝජනය කරන අපි තමයි මේකෙ දුක් ගැහැට දන්නේ, අඩුපාඩුකම් දන්නේ ඒ නිසා අප කතා කල යුතුයි. අපට අවස්ථාව ලබා දෙන්න අපි ඒක පසුවට කතා කරමු.

මෙහි මන්ත්‍රීවරුන් 27 දෙනෙක් ඉන්නවා. අපි හැමෝම කතා කරන්න ඕන. ඒ නිසා මගේ කතාව ඉතාම කෙටියෙන් අවසන් කරනවා. එහෙයින් අප සියළු දෙනාම හදවතට එකගව ප්‍රාදේශීය සභා නියෝජිතයෙක් ලෙස පත්වෙලා අවුරුදු 04 ක නිල කාලය තුල සභාවේ ගරුත්වය, ගරු සභාපතිතුමාගේ, ගරු මන්ත්‍රීවරුන්ගේ, ලේකම්තුමියගේ, කාර්ය මණ්ඩලයේ ගරුත්වය රැක ගෙන අපි වැඩ කල යුතු වෙනවා.

ඒ නිසා ඒ සඳහා ඔබ සියළු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් ඒ වගේම අපේ මේ සභාව මෙහෙයවන නිමල් වික්ටර් නාගොඩ විතාන මන්ත්‍රීතුමා මගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමෙක්.එතුමා මම විශේෂයෙන් මතක් කරනවා.එතුමා 1997 මැතිවරණයේදී මටත් ඡන්දයක් ලබා දුන් මන්ත්‍රීතුමෙක් එතුමාගේ මනාප තුනෙන් එකක් මටත් දුන්නා.ඒ නිසා මේ සභාවෙ නිතර කතා කලා. එතුමා අද නිල වශයෙන් සභාපති ලෙස පත් වූවත් මීට පෙර අවස්ථාවලදී එතුමා තුන්වන ආසනයේ වාඩි වුනත් මම තමයි සභාපති කියපු ගරු මන්ත්‍රී තුමෙක් තමයි.නිමල් වික්ටර් නාගොඩ විතාන මන්ත්‍රීතුමා කියන්නේ එතුමාගේ සිහිනයක් තිබුන ඒ සම්බන්දව ඒ පිළිබඳව මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.ඒ සිහිනය සැබෑ වුනා. ඔබ තුමා ඒ තනතුරට පත් වීම පිළිබඳවද මගේ කිසිදු ගැටළුවක් නැහැ.මම මේ සභාවේ මන්ත්‍රීතුමෙක් ලෙස දිවුරපු දවසේ ඉදල ඊටත් කලින් ඉදල මම ඔබතුමා සමග ඉතාම සහයෝගයෙන් කටයුතු කරල තියෙනවා.මම පහුගිය වසර 10 ක කාලය තුල ඔබතුමාට දවසට දෙපාරක් තුන්පාරක් දුරකථන ඇමතුම් දෙනවා.අජිත් එඩේර ආරච්චි මැතිතුමාටත් මම එලෙස කථා කරනවා.මම අහනවා මේ රටේ තත්වය මොකද්ද රටේ දේශපාලන වාතාවරනය අපි සාකච්ඡා කරනවා.අපේ

අනිත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් සමගත් අපි නිතර කතා කරනවා. අඩුම තරමේ අපි දුක සැප හරි අහනවා. ඇත්තටම සතුටුයි මේ සභාවට ඔබතුමන්ලාගේ මේ තේරී පත්වීම අපි කවුරුත් අද ආණ්ඩු පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව කවුරුත් රීති වලට අනුව අපි අසුන්ගෙන තියෙනවා.අපේ ලේකම් තුමිය අද අපට ආදර්ශයක් සපයල තියෙනවා. ජ්‍යෙෂ්ඨත්වය අනුව අසුන්ගෙන තියෙනවා. ගරු සභාවේ ආසන පැනවීම අද අපි අගය කරනවා. අපේ ප්‍රාදේශීය සභාව අද තිබෙන තත්වයෙන් ඉදිරියට ගේන්න අපි කටයුතු කරන්න ඕන. 2015 අපේ ප්‍රාදේශීය සභාව දිස්ත්‍රික්කයේ පැවති සභා 17 න් 16 වෙනි අවස්ථාවේ පැවතුනේ අපේ ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය පසුගිය වසර තුන තුල කටයුතු කරල පහුගිය අවුරුද්ද වන විට එම ස්ථානය 10 වන ස්ථානයට ගෙනවිත් තියෙනවා. මේ අවුරුද්ද වන විට 7 හෝ 8 වන ස්ථාන වලට පැමිණේවි. මේ අවස්ථාවේ අපි එතුමියටත් ගරු කිරීමක් වශයෙන් මෙම ප්‍රාදේශීය සභාව පලවන, දෙවන හෝ තුන්වන ස්ථාන වලින් එකක් වෙත රැගෙන එන්න මේ කාලය තුල අපි කටයුතු කරමු. ඒ සඳහා අපිට ශක්තිය ධෛර්‍යය ලැබේවා. ඉදිරි කාලයේදී එම වැඩ කටයුතු සිදු කිරීමට මෙම මන්ත්‍රීතුමන්ලාට තුමියන්ලාට ශක්තිය ධෛර්‍යය ලැබේවා. ඉදිරියේදී අප වෙත බලය ලබා දුන් ජනතාවට සේවය කිරීමට සියළු දෙනාටම ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම ඔබ සැමට සුභ පතනවා.

***ඊලගට සිටි අජිත් එඩිර ආරච්චි මහතා නවක මන්ත්‍රීවරුන්ට මුලින් කථා කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.***

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා කථා කරමින්**

මූලාසනාරූඪ සභාපතිතුමාගෙන් අවසරයි ඒවගේම උප සභාපතිතුමන් ප්‍රධාන කොට ගත් මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගෙනුත් ඒ වගේම ලේකම් තුමිය ඇතුළු ඔබ සියළු දෙනාගෙනුත් අවසරයි. මෙම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට මම අද දවසේ ඉතාම සන්තෝසයට පත්වෙනවා.
නැවත අපේ හිටපු මන්ත්‍රීවරු සහ නවක මන්ත්‍රීවරු සමග ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මිනිසුන් වෙනුවෙන් යම් සේවාවක් කිරීමට අවස්ථාව මිනිසුන් අප වෙත උදා කරල තියෙන වෙලාවෙ පලමුවෙන්ම අපේ සභාපතිතුමා පැවසුව පරිදි මම සිහිපත් කරන්න ඕන වත්මන් අපේ සභාපතිතුමා විශේෂයෙන්ම කාලාන්තරයක් තිස්සේ අප සමග ඉතා සුහදව වැඩ කරා. උප සභාපතිතුමත් එහෙමයි. ඒ වගේම මම මේ වේලාවෙ සිහිපත් කරනව අපේ හිටපු සභාපති අජිත් එඩිර ආරච්චි මැතිතුමා අප සමග ඉතා කුළුපගව කටයුතු කලා විතරක් නොවෙයි ඒ එක්කම විපක්ෂයේ වුනත් අපි එකට හිටපු සභාවේ හිටපු සභාපති චන්ද්‍ර සහබන්දු මැතිතුමා ඒ විතරක් නොවෙයි අනෙක් සියළු දෙනාම මම නම් වශයෙන් සඳහන් කරන්නේ නෑ ඔබ සියළු දෙනාම අපි සියළු දෙනාම එකතු වෙලා මේ ගමන යන්න එකතු වුනු වෙලාවේ ඔබ සියළු දෙනාටම අපි සියළු දෙනාටම බලාපොරොත්තු වන ජනතා සේවය ඉටු කරන්න මම ඔබ සැමට සුභාසිංසන එකතු කරනවා. ඒ එක්කම මම මේ වෙලාවෙ පුංචි සිහිපත් කිරීමක් කරනව. මම මීට පෙර සභාවේදී ගුරුවරයෙක් හැටියට මේ සභාව නියෝජනය කලා. අද මම මේ සභාව නියෝජනය කරන්නේ දරු පරපුර වෙනුවෙන්. ඒ සමාජය ගොඩ නගන තැනක තියෙන ආයතනයක ආයතන ප්‍රධානියකු වශයෙන් විදුහල් පතිවරයෙකු වශයෙන්, ඒ නිසා මම ඔබට සිහිපත් කරනව මේ කර්තව්‍යයේදී මන්ත්‍රී තනතුරක් සමග යාමේදී ටිකක් අපහසුතාවයන් තියෙනවා. ගෞරවය රැකගන්න. ඒ නිසා ඔබ සියළු දෙනාගේම ආදරණීය සහයෝගය මට වෘත්තීය ගෞරවය රැක ගැනීම වෙනුවෙන් ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් ඒ බව සිහිපත් කරමින් ඒ එක්කම අපි සියළු දෙනාම දන්නා පරිදි නොයෙකුත් විවේචන මෙම මැතිවරණ ක්‍රමය තුලත් තියෙනවා. සියල්ලට අමතරව ඔබ අප සියඳු දෙනා මේ ස්ථානයට පත් කලේ ජනතාව.ඒ

නිසා අපට ලොකුම වගකීම ලොකුම මෙහෙවර අපට කථා කල යුතු දේවල් කථා කරන්න වෙන්නේ ජනතාව වෙනුවෙන්.ඒ වේලාවේදී අපි මේ මොහොතේ සිහිපත් කරන්න ඕන සභාවක් ගත්තම අපි දන්නව සභාවේ ආදායම වැඩි කර ගැනීමට විවිධ ක්‍රම යෝජනා සභාව තුල ගේනවා. ඒකේ ප්‍රවනතාව කාර්‍යය තමයි ජනතාවගේ බදු මත තමයි අපි මේ සභාව පවත්වාගෙන යන්නේ.මේ වෙලාවෙ මධ්‍යම රජයෙනුත් බදු පිළිබද තීන්දු තීරන ගත් වෙලාවෙ අපට තේරෙනවා මේ වේලාවෙ ජනතාව මොනවගේ හැගීමකින්ද ඉන්නේ කියල.ඒ නිසා ගම්වල ඉන්න ගම්වල මිනිසුන් සමග ඇසුරු කරන අපි සියළු දෙනාගේම වගකීමක් තියෙනවා. මේ බල ප්‍රදේශයේ අපේ ජනතාවගේ බදු මුදල් මතම යැපෙනවාට වඩා අපි ඊටත් වඩා සංවර්ධනාත්මකව කටයුතු කර අපේ සභාවට බදු මුදල් වලට වඩා වෙනත් ආදායම් මාර්ග සාකච්ඡා මගින් ලබා ගත යුතු බව අපේ බුදු දහමේ තිබෙන කරුණුත් සැලකිල්ලට ගනිමින් අපි ප්‍රකාශ කරන්න ඕන.

අපි පක්ෂ විපක්ෂ සියළු දෙනා එකට එකරාශී වී මේ ජනතාව වෙනුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් අපේ සභාපතිතුමා උප සභාපතිතුමා ගෙන යන ඒ කර්තව්‍යට අපි සියළු දෙනා ලිච්චවී පාලන ක්‍රමය සැබෑ අර්ථවත් පාලන ක්‍රමයක් බවට පත් කරන්නට අවශ්‍ය ශක්තිය අපි සියළු දෙනාම දෙමුයි කියන සිහිපත් කිරීමත් කරමින් ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සහයෝගය අප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මඩුල්ලට ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් වඩාත් කාර්‍යක්ෂම සේවාවක් ලබා දීමට කටයුතු කිරීමට රාජ්‍ය සේවය මැදිහත්ව කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමින් ඊට අවශ්‍ය ශක්තිය ධෛර්‍යය ලැබේවායි පතන ගමන්ම අපි මන්ත්‍රීවරුන් සියළු දෙනාටත් සභාපතිතුමාටත් එම ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී යූ පී ගයාන් මදුශංඛ මහතා කථා කරමින්**

ගරු සභාපතිතුමා සහ නියෝජ්‍ය සභාපතිතුමා ලේකම් තුමියගෙන් අවසරයි. මම පළමුවෙන්ම මම ගැන හදුන්වා දීමක් කරන්නම්. සියළුම මන්ත්‍රීවරු මා ගැන දන්නේ නැ. මම මලාමුර කොට්ඨාශය නියෝජනය කරන්නේ. හිටපු මන්ත්‍රී උපුල් අබේසුන්දර මන්ත්‍රීතුමාගේ කොට්ඨාෂයෙන් තමයි මම ඉදිරිපත් වුනේ. එතුමාගේ රැකියාවේ ප්‍රශ්නය නිසා තමයි ඒ කොට්ඨාශයෙන් මම ඉදිරිපත් වුනේ. ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කලේ. ඒ වගේම දේශපාලනය ගැන අපි ලොකු දෙයක් දන්නේ නෑ. මෙහි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම් එක්ක ඒ උපදෙස් අනුව තමයි අපි යම් දෙයක් දැන ගන්න ඕන. ඒ අනුශාසනා අරගෙන අපි ඉදිරියට වැඩ කටයුතු කරනවා. ඒ වගේම අපි විශේෂයෙන්ම ස්තුති වන්ත වෙන්න ඕන ඊයේ අපේ දානේ තිබුණු වෙලාවේ අපේ මන්ත්‍රීවරු 15 දෙනාට අමතරව තව එක මන්ත්‍රීතුමෙක් පමණක් සහභාගි වුනා. ජනතා විමුක්ති පෙරමුණෙන් අපේ මන්ත්‍රීතුමා සහභාගී වුනා. එතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනව.ඒ වගේම අපේ කොට්ඨාසය නියෝජනය කරන අපේ අනෙක් මන්ත්‍රීතුමන්ලාත් එක්ක එකතු වෙලා අපට ලොකු වැඩක් කරන්න පුළුවන් වේවි.සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා කථා කරමින්**

මම මාපලගම කොට්ඨාසය නියෝජනය කරන පියල් ජයරත්න හිරිමුතුගොඩ. මට ග්‍රාම නිළධාරී වසම් 4 ක ප්‍රමානයක් තියෙනවා. සභාවට මම පත් වුනාට පසුව එම ගම් ප්‍රදේශ දියුණු කිරීමට මම බලාපොරොත්තු වෙනවා. සභාවෙන් ඒ දේ සිදු වේවි කියල මම හිතනවා. මෙම සභාවේ

තියෙන මුදල් ශේෂය පිලිබඳව මිනිසුන් දන්නේ නැහැ. එයාලා දැනටමත් මට පොඩි බලාපොරොත්තු ලබා දෙනවා. ඒ වගේම මගේ කොට්ඨාසයට මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. බන්දුල හිරිමුතුගොඩ මහතා, ජනතා විමුක්ති පෙරමුනේ රංජිත් ජයවීර මහතා. අපි තුන්දෙනා එකතු වෙලා අපේ කොට්ඨාශයට සේවය කිරීමට හැකියාවක් ලැබේවායි ප්‍රාර්ථනා කරනව.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා කථා කරමින්**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමන් ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලය සහ ලේකම් තුමියගෙන් අවසරයි. අද දවසේ 2018 පත් වුනු නවක මන්ත්‍රී වරු හැටියට නාගොඩ ප්‍රාදේශීය සභාවට නවකයෙක් විදියට පලමු සැසියට රැස්වෙලා හඳුන්වා දීමට අවස්ථාව ලබාදීම පිලිබඳව සභාපතිතුමා සහ සවන්දෙන සියළු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම. අපි නවකයෝ හැටියට අද දවසේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභා සැසියක වාඩිවෙලා එම අත් දැකීම් විද ගන්න අවස්ථාවේදී පළමුවෙන්ම සිහිපත් වෙන්නේ මෙතනට අපි අද නවකයන් හැටියට ආවත් මීට පෙර මෙම සභාවේ අසුන් ගත් විදිය පැහැදිලි කරායින් පස්සේ මා සතුටු වෙනව අපි එකමුතු වෙලා සියළු පක්ෂ ඒ සභාවේ ලේකම් තුමිය සහ සභාපතිතුමන් සකස් කල විදියට වාඩිවෙලා අපි සුහදශීලිතාව රැකගෙන මෙතෙක් වෙලා රැඳී සිටීම පිළිබඳව. ඒ වගේම සභාපතිතුමාට අද දවසේ අපේ පක්ෂයේ අපි 15 දෙනාම පත්වුනත් අපට පුංචි ගැටළුවක් තිබුනා. සභාපතිතුමා කවුරු පත්කර ගන්න ඕනද කියල. එතනදි මා පළමුවෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕන අපේ සභපතිතුමාට නෙවෙයි අපේ උප සභාපතිතුමා වන ගාමිණී සුසන්ත මහතාට. මොකද එතුමාගේ කැපවීම, කැප කිරීම තුල තමයි අද දවසේ අපිට ඒකරාශී වෙලා නිමල් වික්ටර් නාගොඩ විතාන මැතිතුමා අපේ සභාපති විදියට පත් කරගෙන සභාවේ වැඩ කටයුතු මේ අයුරින් කරගෙන යන්න පුළුවන් වුනේ. ඒ පිළිබඳව මම ගාමිණී සුසන්ත උප සභාපතිතුමාට ස්තුති වන්ත වෙනවා. ඒ වගේම කාල වේලාව අපට බොහෝ දුරට නොමැති වුවත් වසර 2යි මාස 10ක්ම සභාව කිසිම මහජන නියෝජිතයෙක්ගේ පාලනයක් නැතුව ලේකම් තුමිය විසින් කොමසාරිස් පාලනය යටතේ පාලනය කරගෙන ආපු සභාවක් හැටියට අපේ ගම් ප්‍රදේශයට විශාල අඩුපාඩුකම් තිබුනත් පුළුවන් ආකාරයෙන් එය ඉටු කර දී වීථි ලාම්පු ඒ යටිතල පහසුකම් සපයා දීමෙන් සභාව මෙතෙක් කල් කරගෙන ආවට මම ලේකම්තුමිය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටම ස්තුති වන්ත වෙනව. ඒ වගේම දේශපාලනික කරලියට මම පලමු වරට තමයි ඉදිරිපත් වුනේ. ඊට පෙරාතුව මගේ කොට්ඨාසය නියෝජනය කරපු අපේ වසන්ත කුමාරගේ මහතා මගේ හිතවතෙක් හැටියට එතුමාගේ දේශපාලනයේදී මම එතුමාට උදවු කලා. නමුත් අපි මේ දේශපාලන ගමන යද්දි පුංචි පුංචි නොහොද නෝක්කාඩුකම් ඇති වෙන්න ඇති. ඒවා අපි අමතක කරල අපේ ගම පරණතානායම්ගොඩ කොට්ඨාසය දියුණු කරමු. අපි දෙන්නටම අමතරව අපිට තව මන්ත්‍රීවරියක් ඉන්නව. කෙසෙල් ඇවරිය පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමිය ඇතුළුව මේ කොට්ඨාශයට මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. පරණතානායම්ගොඩ කොට්ඨාසයට පත්වුනු අපි තුන්දෙනා කොට්ඨාසය දියුණු කරමු යැයි ඉල්ලීමත් කරමින් මම පරණතායම්ගොඩ උදයශාන්ති සෙන්ටර් ව්‍යාපාරයේ අධිපතිතුමා හැටියට ඒ වගේම ධර්මසිරි ගනේවත්ත හැටියටත් මම සියළු දෙනාටම හඳුන්වා දෙමින් ඔබ සියළු දෙනාගේ ඒකරාශීත්වය අපට මතුවට ලබා දෙන්න කියා. මන්ත්‍රීවරුන්ගෙන් සහ ප්‍රාදේශීය සභාවේ සියළු කාර්ය මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුභාෂි ඒකනායක මෙනවිය කථා කරමින්**

ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම දේශපාලනයට නවකයෙක්. මුලින්ම මම කවුද කියල හදුන්වල දෙන්නම්. මම සුභාෂි මදුමාලි ඒකනායක. මම ගම්මැද්දේගොඩ කොට්ඨාසයෙන් අළුත් දේශපාලන පක්ෂයකින් අළුත් ඡන්ද ක්‍රමයක් තුලින් තරග වැදිල නාගොඩ ප්‍රාදේශීය සභාවට එන්න හැකියාව ලැබුනා. ඒ වගේම ගොඩක් සතුටු වෙනවා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී මඩුල්ලක් සමග සභාවේ එකට කටයුතු කරන්න ලැබීම පිලිබදව. මට මෙම අවස්ථාවට නාගොඩ ප්‍රාදේශීය සභාවට එන්න සහයෝගය දක්වපු ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු මගේ සහෝදර මන්ත්‍රී මඩුල්ලට මම මේ අවස්ථාවේ ස්තූතිය පුද කරන්න කැමතියි.ඒ වගේම ඉදිරියේදී පක්ෂ විපක්ෂයකින් තොරව එකට එකතු වෙලා ජනතාවගේ කැමැත්ත මත ජනතාවට සහාය දක්වමු කියල ඉල්ලා සිටිනවා.සුභ අනාගතයක්.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා කථා කරමින්**

  මූලාසනාරූඪ ගරු සභාපතිතුමණි, මම උඩුගම අංක 06 කොට්ඨාසය නියෝජනය කරන වෙරංග ලක්මාල් එඩේර ආරච්චි. මම හිතනවා අද මට මගේ ජීවිතයේ බෝහෝම සතුටු දායක දිනයක්. මේ ප්‍රාදේශීය සභාවේ භූමිකාව තුල මා දේශපාලනය කලේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින්.ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා නියෝජනය කරන නායකත්වය සපයන පක්ෂයෙන් මා නාගොඩ ප්‍රාදේශීය සභාව තුලට පැමිණි නිසා, මම එතුමාටත් එතුමාගේ පක්ෂයටත් ප්‍රථමයෙන්ම හිස නමා ආචාර කරනවා. මම පළමුවෙන්ම දේශපාලනය කරන්න බලාපොරොත්තු වුනේ නෑ. ඒ වුනත් මම මේ වේලාවේ අවස්ථාවක් කර ගන්නවා මම මෙම දේශපාලන භූමිකාවට ගෙනාපු මගේ ආදරණීය අයියන්ඩිය වන අජිත් එඩේර ආරච්චි  මහතාට විශේෂයෙන්ම ස්තුති කරන්න. එතුමා තමයි මම මේ දේශපාලනයට ඇදල දැම්මෙ ඒ නිසා  ඇත්තටම මම මේ සභාවෙදි සතුටු වෙනව අයියටයි මල්ලිටයි එකට වාඩිවෙලා වැඩ කරන්න ලැබීම පිලිබදව.අපි මුලදි එකට එකතු වෙලා වැඩ කලත් විවිධ දේශපාලන කරුණු කාරනා මත පසු කාලීන වෙන්වෙන්න සිදුවුනා. මේ අවස්ථාවක් කර ගන්නවා ඔබතුමාට හිස නමා ආචාර කිරීමට.ඒ වගේම මගේ සහෝදර අපේක්ෂිකා ගයන්ති කුමාරි ආදරණීය මන්ත්‍රීතුමිය. මම හිතනව මමත් ඔබත් දේශපාලන කාලය තුල මෙච්චර කාලයක් තුල වචනයක්වත් අපි අහිතක් වුනේ නෑ. අපි සහයෝගයෙන් වැඩ කරමු. ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් අංක 06 කොට්ඨාශය කියන්නේ නාගොඩ ප්‍රාදේශීය සභාවට ඉතාම වැදගත් කොට්ඨාශයක් මොකද ආර්ථික වශයෙන් ගොඩනැගිලි වශයෙනුත් සභාවට වැදගත් වූ කොට්ඨාශයක්. ඒ නිසා මම යෝජනා කරනව මගේ සහෝදර මන්ත්‍රීතුමියත් මමත් එකතු වෙලා අපේ ගම සංවර්ධනය කරන වැඩ පිළිවලට දායක වෙන්න කියල මම ඉල්ලා සිටිනවා. අපි සහෝදරත්වයේ දෑත් දිගු කරල මේ ප්‍රාදේශීය සභාව අර්ථවත් ක්‍රියාශ්‍රීලි සහ අපේ දැක්ම සහ මෙහෙවර තුල ඉදගෙන ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු කරන බලාපොරොත්තුවෙන් සභාපතිතුමාට හා උප සභාපතිතුමාට ඒ සහයෝගය දක්වන බව ප්‍රකාශ කරනව.සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතා කථා කරමින්**

ගරු සභාපතිතුමා,  උප සභාපතිතුමා සහ ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. මම හිතන්නේ මම හෝමදොල කොට්ඨාසයේ සමන් විතානගේ. ප්‍රථමයෙන්ම ගෞරවය ස්තුතිය පුද කරන්න ඕන මගේ ආදරණීය හෝමදොල කොට්ඨාශයේ ගම් වාසීන්ට. එතුමන්ලා ලබා දුන් ඡන්දයෙන් තමයි අද මට නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාඩිවෙන්න අවස්ථාව ලැබුනේ. එහිදී මම ප්‍රථමයෙන්ම ගෞරවය පුද කරන්න ඕන පිරිසක් ඉන්නවා. මට ගාමිණි සුසන්ත මන්ත්‍රීතුමාගෙන් මෙම අවස්ථාවට එන්න කියල ආරාධනා ලැබුනා. මගේ ආදරණීය නායක ගාමිණී සුසන්ත මැතිතුමා සහ අජිත් එඩේර ආරච්චි මැතිතුමා මම මේ වෙලාවේ ආදරයෙන් සිහිපත් කරමි.

එතුමන්ලාලබා දුන් ශක්තිය තුලින් අද මට මෙතන වාඩිවෙන්න ශක්තිය ලැබුනා. ඒ වගේම අපේ හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා මේ වෙලාවේ ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන්න ඕන. එතුමා මට විශාල සහයක් දුන්නා. එතුමාගේ පුතනුවන් අද අපිත් එක්ක ඉන්නව. විපක්ෂයේ හිටියත් තරංග සුදර්ශන මන්ත්‍රීතුමාත් මම ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. අපි ගම තුල දේශපාලනය කිරීමේදී පක්ෂ භේදයකින් තොරව දේශපාලනය කල පිරිසක් විදියට තරංග සුදර්ශන මැතිතුමා දන්නවා ඇති. එතුමාලත් අපට දුන් සහයෝගය ඉතා විශාලයි. ඒ වගේම චන්ද්‍රසිරි මහතාත් මතක් කරන්න ඕන. ඒ වගේම අපි 15 දෙනා එක අම්මගේ දරුවො වගේ තමයි වැඩ කලේ. ඒ අපගේ සභාපතිතුමා සහ උප සභාපතිතුමා දුන් ශක්තිය තුලින් අපි එක අම්මගේ දරුවො වගේ කටයුතු කරද්දි පුංචි අමනාපයක්වත් නොවී අපට කටයුතු කරන්න ශක්තිය ලැබුනේ ඔබලා ලබා දුන් ශක්තිය ජවය නිසා. ජ්‍යෙෂ්ඨයෝ ඉස්සරහ අපි නවකයෝ විදියට ඉද්දි අපෙන් අඩුපාඩුකම් වෙන්න පුළුවන් අපට අපේ අඩුපාඩුකම් පෙන්වා දීල අපේ ආදරණීය ගම් වාසීන්ට මෙන්ම හෝමදොල කොට්ඨාසයට ඒ වගේම අනෙක් කොට්ඨාශ වලට සේවය කරන්න අපට ශක්තිය දෙන්න කියල ගරු සභාපතිතුමාගෙන් ඉල්ලන අතර ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී වරුන්ගෙන් නවකයින් විදියට අපට ශක්තියක් වන ලෙසද ඉල්ලා සිටිනවා. අපට ආශීර්වාදයක් වෙන්නට අපි වැඩි පිරිසක් ඉන්නෙ නවකයින්. නවකයින් වුනාට අපට ඉතා විශාල වැඩ කොටසක් නාගොඩ ප්‍රාදේශීය සභාව තුල කරන්න පුළුවන්. අවුරුදු 02 යි මාස 10ක් නාගොඩ ප්‍රාදේශීය සභාව පාලනය කල ගරු ලේකම්තුමිය මේ වෙලාවේ සිහිපත් කරමින් නැවතත් හෝමදොල කොට්ඨාශයේ ජනතාවට ස්තුතිවන්ත වෙමින් හැමදෙනාටම සුභ පතමින් මම නිහඬ වෙනව.

**ප්‍රාදේශීය සභා ගරු අමර ධනංජය විලේගේ මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. ඇත්තෙන්ම මම පළමුවෙන්ම සුභ පතන්න ඕන අපේ ගරු සභාපතිතුමාට විශේෂයෙන්ම කියනවනම් ලංකාවේ පළමුවෙන්ම ආරම්භ වුන කුළුදුල් පක්ෂය විදියට අපි ඉදිරිපත් වෙලා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ ඒ පක්ෂය ජයග්‍රහනය කළා. එදා කිව්වේ ජී. එල්. පීරිස් මහතාගේ පක්ෂය කියලා. නමුත් ඇත්තටම අපේ නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමාගේ සහ ජී. එල්. පීරිස් මැතිතුමාගේ නායකත්වය යටතේ නවක මුහුණු 15 ක් යටතේ අපි ඉදිරිපත් වෙලා සියළු දෙනාම ජයග්‍රහනය කළා. ඒ සම්බන්ධව සියළු මන්ත්‍රීවරුන්ට මම සුභපතනවා. ඒ වගේම අපිත් එක්ක තරග කරලා පැරදිලා අද විපක්ෂයේ මන්ත්‍රීවරු විදියට සහභාගි වන ඒ මන්ත්‍රීවරු සියළු දෙනාටත් මගේ සුභාෂිංශන පිරිනමනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවට මෑත කාලීනව මම ආපු දෙවන දවස අදයි. මොකද මම මුලින්ම ආවේ මගේ පියා සභාපතිධුරය භාර ගනිද්දි . නමුත් ඊට පසුව කිසිම අවස්ථාවකදී මම මේ සභාවට ආවෙ නැහැ. අඩුම තරමේ මම මේ කාර්යාලයට සම්බන්ධ වුනේ නැහැ. විශේෂයෙන්ම මතක් කරන්න ඕන ඒ ආපු පළමු දවස්වල මේ සභාවෙ තිබුනු තත්වය ගැන ප්‍රකාශ කරනවානම් සභාවේ ජලයවත් තිබුනෙ නැහැ. හැමදාම උදේට තාත්තා ගෙදරින් ආවෙ ජලය කෑන් 2 ක් අරගෙනයි. ඒක මේ සභාවේ කාර්යමණ්ඩලය ස්ථිර කරාවි. එතකොට තිබුණු වාහන ගැන කතා කරනවා නම් ට්‍රැක්ටර් 2 යි. ට්‍රැක්ටර් 02ම කැඩිලා. ලයිට් හදන මැෂින් එකයි තිබුනේ. අද වෙනකොට මගේ පියාගේ ධූර කාලය තුළ සභාවට වාහන අරගෙන තියෙනවා. කෘෘ කැබ් රථය , නවතම කැබ් රථය, ටිපර් රථය, බවුසර් රථ විශාල ප්‍රමාණයක් වාහන 10 කට 15කට ආසන්න ප්‍රමාණයක් පසුගිය කාලය තුල අරගෙන තියෙනවා. මම ඉතාම සංවේදීව හා ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා. එවැනි පියකුගේ පුතකු වශයෙන් මේ අවස්ථාවට සම්බන්ධ වීම විශාල ගෞරවයක්. ගරු සභාපතිතුමනි, ඒ සියළු වාහන අබලන් තත්වයේ තියෙන්නෙ. ඒක නිලධාරීන්ගේ වැරැද්දක් නෙවෙයි. ඒ පසුගිය වසර 02 කාලය තුළ ඒවා අරාපිත කරලා මේ

මිනිසුන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිය අහෝසි කරලා කර ගෙන ගිය මේ දුර්දාන්ත ආණ්ඩුවේ ප්‍රතිවිපාක තමයි. අද වන විට එම සම්පත් විනාශවෙමින් පවතිනවා. ගරු සභාපතිතමනි, අද ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඒ කටයුතු පිළිබඳ සොයාබලලා ඒ දේවල් සංවර්ධනය කරන්න. මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ මේ රටේ පැහැදිලි ජනමතය ඒ ජනමතය එක්ක ඉදිරියේ කටයුතු සාර්ථක කර ගන්න අපි ඔබතුමාට ශක්තිය දෙනවා. ඒ කටයුතු අපි සාර්ථක කර ගනිමු. ඉදිරියේදී අපේ ජනාධිපතිවරයෙක්, අපේ අගමැතිවරයෙක් සහ අපේ ආණ්ඩුවක් යටතේ මේ ප්‍රදේශයේ සියළු ජනතාවට සාර්ථක සේවයක් ලබා දී අපි කටයුතු කරමු. ඒ දක්වා යන ගමන සාර්ථක කර ගන්න විශේෂයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සියළු මන්ත්‍රීවරුන්ගේ සහය ලබාදෙන්න කියලා මතක් කරන ගමන් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. මගේ නම ප්‍රියන්තා ගුණසේකර මම 212 කැප්පිටියාගොඩ ග්‍රාම සේවා වසම නියෝජනය කරමින් තේරී පත් වුනු මන්ත්‍රීවරියක්. විශේෂයෙන්ම අද දවසේ මේ ස්ථානයට එන්න ලැබීම ගැන මම ගොඩක් සතුටු වෙනවා. ඒ පිළිබඳව මා මෙතෙන්ට ගෙන ඒමට උත්සාහ කල සියළුම ජනතාව වෙනුවෙන් මගේ කෘතවේදී ස්තූතිය මා මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒත් එක්කම මා අද දවසේ සතුටු වෙනවා මන්ද යත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු රැසක් හඳුනාගැනීමට අවස්ථාව ලැබුණා. ඒවගේම ඉදිරි කාලය තුළදී මේ සභාව තුළ ක්‍රියාත්මක වන සියළු දේටම සියළු දෙනාත් එක්කම එකට අත්වැල් බැදගෙන ඉදිරි දැක්මක් දකින්න කැමැත්ත ප්‍රකාශ කරමින් සියළු දෙනාටම සුභ දවසක් පතමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පතිනායක මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ඒ වගේම ලේකම්තුමියගෙන්ද අවසරයි. මම හිතන්නෙ මම ඌරල කොට්ඨාශය නියෝජනය කරමින් ජනතා වරමින් තේරී පත් වුනු මන්ත්‍රීවරයෙක් හැටියට මේ සභාවේ අසුන් ගන්නවා. ඒ වෙනුවෙන් මගේ ප්‍රණාමය ඌරල ගමේ ග්‍රාම සේවා වසම් 04 හි සිටින සියළුම ජනතාවට පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. මම මන්ත්‍රීවරයෙක් හැටියට ඉදිරිපත් වුනේ අපේ ගමේ අයගෙ කැමැත්ත මත මම මේ අවස්ථාවට සහභාගි වුනේ ඒ නිසා. මට මේ අවස්ථාව ලබා දීම අපේ අරුණ ජයන්ත මහතා. එතුමා කලින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නමින් අපේක්ෂකත්වය දැරූ මහත්මයෙක්. ඒ මහතා වෙනුවට තමයි ඒ මහතාගේ ආශිර්වාදය අනුව මම මෙතන අසුන්ගෙන සිටින්නේ. අපි 15 දෙනාම එක මවකගෙ දරුවො හැටියට තමයි කටයුතු කලේ. අපේ සංවිධායකතුමා සම්පත් අතුකොරල මැතිතුමා අපට විශාල ශක්තියක් වුනා මේ ගමනට එතුමාගේ මගපෙන්වීම හා වැඩපිළිවෙල යටතේ අපි මෙතනට පැමිණ තියෙනවා. හිටපු සභාපතිතුමෙක් වන චන්ද්‍රා සහබන්දු මැතිතුමා අපේ කොට්ඨාශයේ සිටිනවා. එතුමගේ උපදෙස් අනුව අපි දෙන්නට අපේ කොට්ඨාශයට විශාල සේවයක් කිරීමට හැකි වනු ඇතැයි විශ්වාස කරනවා. ඒ වගේම සියළුදෙනාගේම සහයෝගය අපට ලබා දෙන්න ඕන. අපි නවක මන්ත්‍රවරු හැටියට අපේ වැරදි අඩුපාඩු ඇතොත් ඒවා කියාදෙන්න. ඉදිරි ගමනක් යාමට සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු සියල්ලන්ගේම සහයෝගය ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

පතිනායක මැතිතුමා අසනීප තත්වයේ රෝහල්ගතව සිට වුවත් මේ අවස්ථාවට සහභාගි වීම පිළිබඳව ගරු සභාපතිතුමා ස්තූතිය පුද කර සිටියේය.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විපිත් සහබන්දු මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. අපට මේ අවස්ථාවට ඒම පිළිබඳව පළමුවෙන්ම ස්තූතිවන්ත වෙන්න ඕන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ හිටපු විධායක ජනාධිපතී අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන්ට. එතුමා විශේෂයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව සිහිපත් කරනවා. එතුමාගේ ක්‍රියාකලාපය නිසා අපි මෙතනට ආවා. ඒ වගේම එතුමාට ගමේ ජනතාව හොඳට සැළකුවා. ගමේ අපි ගැන විශ්වාසයක් තිබ්බා. මේ ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රී සඳුන් ජයවිරාජ් ගුරුසිංහ මැතිතුමන්ව මම සිහිපත් කරන්න ඕන. එතුමා මගේ නිවසටම ඇවිත් එතුමාගේ බලවත් ඉල්ලීම නිසා තමයි මම ඉදිරිපත් වුනේ. ඒ වගේම ගමේ මිනිස්සු නිවසටම ඇවිත් කරපු ඉල්ලීම නිසා තමයි මම මෙතනට ආවේ. ඒ සියළු දෙනාටම මම ස්තූතිවන්ත වෙනවා. මේ සියළු දෙනාම ඥාති හිතවතුන් තමයි. මගේ ගම යටලමත්ත මාත් එක්ක තරග කලේ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා එතුමා සමග අපි සහයෝගයෙන් කටයුතු කළා. අපේ ගමේ කටයුතු වෙනුවෙන් එතුමාගේ ශක්තිය ලබාදෙන්න කියලා ඉල්ලනවා. ඒ වගේම අපේ කටයුතුවලට ඔබ සියළු දෙනාගේ උදව් උපකාර ලැබේවායි ප්‍රාර්ථනා කරමින් ඒ වගේම මෙහි සංවිධායක ලෙස කටයුතු කරන සම්පත් අතුකෝරල මැතිතුමා සියළු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. ප්‍රථමයෙන් මම ස්තූතිවන්ත වෙනවා මට මේ ස්ථානයට ඒමට අත දුන් ගරු රනිල් වික්‍රමසිංහ මැතිඳුන්ට. එතුමා 25% ක කාන්තා නියෝජනයක් ගෙනාපු නිසා තමයි අපි අද මෙතෙන්ට ආවෙ. නැත්නම් අපේ හිතේ අදහසක් තිබුනෙ නැහැ මේ ස්ථානයට එන්න. ඒ වගේම මෙම කාර්යයට උර දුන්නෙ මගේ මහත්තයා. ඒ ගැන එතුමන්ටත් ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම අපේ පක්ෂයේ ප්‍රධාන සංවිධායක සුනිල් සේනානායක මැතිඳුන්ටත් මම ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම ගමේ ඡන්දය දුන් සියළු දෙනාටත් මම ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම අපේ ගමේ තව මන්ත්‍රීතුමෙක් ඉන්නවා. ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමා අප දෙදෙනා කිසිදු වාද භේදයකින් තොරව ගමේ ප්‍රචාරණ කටයුතු කළා. අපි ඉදිරියටත් එම කර්තව්‍යය ඒ විදියටම කර ගෙන යමින් අපේ ගමේ දියුණුවට වැඩ කරන්න හිත යොමු කර ගන්නවා. ඒ වගේම අපි යමක් කරන කොට අප ඉදිරියේ ඉන්නවා අපේ පකෂයේ මන්ත්‍රීවරු හතර දෙනෙක් අපි එතුමන්ලගෙන් අදහස් විමසලා තමයි ඉදිරි වැඩ කරන්නේ ඔවුන් දැවැන්තයෝ අපි හාල්මැස්සෝ වගේ අය ඔවුන්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු කිරීමට අදිටන් කර ගනිමින් මගේ කතාව අවසන් කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. මම චන්දිමා දිල්රුක්ෂි මලාමුර කොට්ඨාශය නියෝජනය කරමින් මන්ත්‍රීවරියක් වශයෙන් තෝරා පත් වුනේ. මම මුළින්ම මේ අවස්ථාවේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ අපේ හිනිදුම ආසනයේ සංවිධායක සුනිල් සේනානායක මැතිතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මොකද එතුමන් දෙපළ නිසා තමයි අපි මේ අවස්ථාවට යොමු වුනේ. ඒ සඳහා සහයෝගය ලබා දුන් අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් සිව් පලටත් මම බෙහෙවින්

ස්තුතිවන්ත වෙනවා. ඔවුන්ගේ අවවාද අනුශාසනා මත ඉදිරි කටයුතු කර ගෙන යාමට මම බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. මම නියෝජනය කරන්නේ බද්දේගම ආසනයට අයත් උඩුගම කොට්ඨාශය මේ අවස්ථාවට සහභාගි වෙන්න අවස්ථාව ලැබීම ගැන බොහොම සතුටු වෙනවා. මම දන්න විදියට නාගොඩ ප්‍රාදේශීය සභාවේ කාන්තා නියෝජනය කරන පළමු අවස්ථාව තමයි මේ. ඒ පිළිබඳව මම ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. 25% ක කාන්තා නියෝජනයක් ලබා දීම පිළිබඳව. ඊළගට මගේ ආසන සංවිධායකතුමන් පිළිබඳව බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමාටත්, සුනිල් සේනානායක මැතිතුමාටත් මම මේ වෙලාවේ බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මගේ මහත්තයා මේ වෙලාවෙ කොහෙත්ම අමතක කරන්න බැහැ. එතුමා තමයි මට ලොකු ශක්තියක් වුනේ මෙතෙන්ට එන්න. ඒ වගෙම මා සමග උඩුගම කොට්ඨාශය නියෝජනය කරන්නෙ තරංග සුදර්ශන මැතිතුමා . මට එතුමාගේ සහයෝගය නිතරම ලැබුන. ඒ වගේම මගේ සහෝදර වෙරංග ලක්මාල් මැතිතුමා තමයි අනිත් පැත්තෙන් තරග කරලා මෙතන නියෝජනය කරන්නේ. අපි සහයෝගයෙන් කටයුතු කරමු. එතුමා කිව්වා වගේ සභාවට අයිති වත්කම් ගොඩක් තියෙන්නේ මම නියෝජනය කරන උඩුගම කොට්ඨාසයේ . ඒ වගේම සභාවට ලොකු ආදායමක් ලබා ගත හැකි කොට්ඨාශයක්. ඒ කොට්ඨාශයෙන් කාන්තා නියෝජනයට ඉන්නෙ මම විතරයි. ඒ නිසා අනෙක් කාන්තා නියෝජිතයනුත් මට සහයෝගය දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. එමෙන්ම අනෙක් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන්ද සහය ලැබෙයි කියා බලාපොරොත්තු වන අතර මගේ කතාව නිම කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. ඇත්තටම මම ප්‍රථමයෙන් කියන්න ඕන මම එක්සත් ජනතා නිදහස් සංධානය නියෝජනය කරනවා. ඒ සදහා පළමුවෙන් ස්තූතිවන්ත වෙන්නෙ අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ටයි. ඒ වගේම එම යෝජනාව සම්මත කල ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සිහිපත් කල යුතුයි. එතුමන් දෙදෙනා නොසිටින්න අපට මේ තැනට එන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා එතුමන්ලාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. එමෙන්ම මෙම ආසනය නියෝජනය කරන පියසේන ගමගේ මැතිතුමාද සිහිපත් කළ යුතුයි. එතුමාගේ ආශිර්වාදය මත තමයි අපි මෙතනට පැමිණියේ. අපේ සභාවේ යටලමත්ත ගම නියෝජනය කරන තුන්පලක් සිටිනවා. වැඩක් බෙදෙනවා නම් අපි තුන් දෙනෙකුට බෙදෙනවා. අපේ නිශාන්ත නන්දන මැතිතුමා, විජිත් සහබන්දු මැතිතුමා සහ මම. ඒ නිසා සභාවෙන් අපට කිසිම අඩුපාඩුවක් වෙනෙකක් නැහැ. ඇත්තටම මම දැකපු දෙයක් තමයි මේ යටලමත්ත ගම්වාසීන්ට අනතුරු සහිත පාරවල් තියෙනවා. වීථි පහන්වලින් අඩුපාඩු තියෙනවා. මම හොයලා බැලුවා. දැන් විදුලි බඩු නැහැ. ඒ ටික සවි කර දිය යුතුයි. මම එය යෝජනාවක් හැටියට ඉදිරිපත් කරමි. අද ඇත්තටම අමතක කල නොහැකි දවසක් විශ්වාසභංගයක් ඉදිරිපත් කර තිබෙන මොහොතක එම විශ්වාසභංගය දිනුවත්, පැරදුනත් මේ 27 දෙනා එකට ඉදගෙන වැඩකරමු කියා අදිටන් කර ගනිමින් ඔබ සැමට සුභ සන්ධ්‍යාවක් පතමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අරුණා ශාන්ති මහත්මිය**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. මා එක්සත් නිදහස් පෙරමුනෙන් තරග වැදි බොදර ගමගේ අරුණ ශාන්ති. මම තරගවැදුනේ පරණතානායම්ගොඩ කොට්ඨාශයෙන්. මගේ පදිංචිය ගෝණදෙනිය හගරන්වල කොට්ඨාසය අපට ලැබිලා තියෙන්නේ ප්‍රසාද මන්ත්‍රී ධූරයක් ඒ ප්‍රසාද මන්ත්‍රීධූරය ගරු උපාලි අමරසිරි මැතිතුමා විසින් අපට ලබා දුන් දෙයක්. මට මෙය ලබා ගැනීමේදී මගේ මහත්තයා ගොඩක් උදව් කළා. සමහර විට ඔබ කවුරුත් දන්නවා ඇති. විශේෂයෙන් තරංග මන්ත්‍රීතුමා දන්නවා. මම මගේ මහත්තයට ස්තූතිවන්ත වෙනවා. ගරු උපාලි අමරසිරි මැතිතුමාටත්, මා සමග සිටි යහළුවන්ටත් මම ස්තූතිවන්ත වෙනවා. අපි නවකයින් අපි දන්නෙ නැහැ දේශපාලනය ගැන. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගේන් ගරු සභාපතිතුමාගේ උපදෙස් මත තමයි අපි ඇවිත් ඉන්නේ. අපි ආවෙ ජනතාව වෙනුවෙන් ඒ නිසා ඔවුන් වෙනුවෙන් වඩාත් හොද, අවංක සේවයක් සිදු කළ යුතුයි. අපේ සභාව දකුණු පළාතේ තියෙන හොදම සභාව කර ගැනීමට කවුරුත් පක්ෂ,විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරන්න යැයි මම ආරාධනා කරනවා. මට පුළුවන් හැම ශක්ති ප්‍රමාණයෙන්ම සභාපතිතුමාට සහයෝගය ලබා දෙන ලෙස පවසමින් මම නිහඬ වෙමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමියගෙන්ද අවසරයි. කොට්ඨාශ 15 ක් නියෝජනය කරමින් මට වරම් ලබා දුන් අපේ ජනතා විමුක්ති පරමුණේ සියළුම සහෝදර සහෝදරියන්ට මම මේ අවස්ථාවේදී ස්තූතිය පුද කර සිටිනවා. ඒ වගේම තමයි කොට්ඨාශ 15න්ම මා නියෝජනය වන බව සියළු දෙනාම දන්නවා. ඒ වගේම මේ ලේකම්තුමියට අපේ ස්තූතිය පුද කරනවා. මම තමයි ඉස්සෙල්ලම දිව්රුම් ප්‍රකාශය ගෙනත් ඔබතුමියට භාරදුන්නේ. මට නිතරම කතා කරන අපේ සභාපතිතුමන් කියන්නේ අපේ දේශයට, අභිමානයක්, ගෞරවය රැකෙන විදියට දූෂණය වංචාව නැති ජවයක් ඇති මිනිසෙක් තමයි අපට වුවමනා වෙන්නෙ කියලා. ඒ නීතිරීති වලට අනුව වැඩ කටයුතු කිරීම තමයි අපේ පරමාර්ථය ඒ නිසා අපි භේද භින්න වෙන්න කිසිම හේතුවක් නැහැ. අපේ ග්‍රෝත්‍රික ක්‍රම අපට අවශ්‍ය නැහැ. ආගම් භේද අවශ්‍ය නැතුව දේශපාලනය හරියට කර ගෙන ඒ දේශපාලනය මගින් දරණ මතිමතාන්තර නිසි ආකාරව මේ සභාව තුළ ගෙනියමු. ඒ අනුව සභා විෂය පථයට අනුකූලව අපි වැඩ කරමු. නවක දරුවෙක් ගර්භාෂගතවුදා පටන් මරණය දක්වා කාර්යයන් රැසක් එනම්, දරුවන්ගේ පූර්ව ළමා විය සංවර්ධන කටයුතු ඒ වගේම තමයි පෙර පාසල් විධිමත්ව කරන්න ඕන. අනික තමයි පුස්තකාල ගැන මම හොයලා බැලුවා. පුස්තකාල ශ්‍රේණි 3 ක් තියෙනවා. I,II,III කියලා දැනට III ශ්‍රේණියේ පුස්තකාල විතරයි තියෙන්නේ. ඒ වගේම තමයි ඉස්සර ජංගම රථයක් භාවිතා වුනා. දැන් භාවිතා වෙන්නේ නැහැ. මම ඉල්ලා සිටිනවා ඒවා ඉදිරියට කර ගෙන යමු කියලා. ඒ වගේම තමයි මරණය දක්වා කියලා මම කිව්වෙ ආදාහනාගාරයක් අපට අනිවාර්යයෙන්ම අවශ්‍යයි. ඒක කොහොමහරි ඉටු කර ගනිමු කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපිට තව කතා කරන්න තිබුනත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට කතා කරන්න ඉඩ සළස්වමින් මා කියා සිටින්නේ ඔබ සියළු දෙනා ගන්නා තීරණවලට අපි සත්‍ය එකගතාවය පළ කරනවා. අපේ ගමේ ජනතාවට අපි එදා කිව්වෙ සත්‍ය නායකයො ටිකක් පත් කර ගන්න කියලා ඒ පිරිස තමයි අද ඉන්නේ. ඒ නිසා සැබෑ අයිතීන් උදෙසා අපි සියළු දෙනා එක්ක එකට එකතු වෙනවා කියලා මම ප්‍රකාශ කරමින් මේ අවස්ථාව ලබා දුන් සභාපතිතුමාට නැවත් ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, ලේකම්තුමිය, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. මම මේ වෙලාවෙදි සතුටුවෙනවා නාගොඩ ප්‍රාදේශීය සභාවට ක්‍රමවත් නැති පොඩි ළමයෙක් පවා හාස්‍යයට ලක් කරන ඉතාම විලිලැජ්ජා සහගත මැතිවරණ ක්‍රමයක් හදුන්වලා දීලා ගමේ පරාජය වුනු පුද්ගලයත්, ජයග්‍රහනය කල පුද්ගලයත් මේ මැතිවරණ ක්‍රමය තුළින් පත්වෙනවා. අපි කිසිම කෙනෙක් කිසිකෙනෙක් ගැනවත් අවඥා සහගතව බලන්නෙ නැහැ. මේ 27 දෙනාම මේ ප්‍රාදේශීය සභාවේ සිටිය යුතු ඉතාම ජ්‍යේෂ්ඨ පුද්ගලයෝ. අපි ආවෙ කිසිම කෙනෙකුට මඩගහන්න නෙවෙයි.

අපි ඇත්තටම අපි බලාපොරොත්තු වෙන්නේ මේ මැතිවරණ ක්‍රමය විවේචනය කිරීම යි. අපි මේක මේ අවස්ථාවේ විවේචනය කල යුතුයි. මේ ක්‍රමයට අපි සභාපතිතුමා ඇතුළු කිසි කෙනෙක් වග කිව යුතු නැහැ. මම මැතිවරණ ක්‍රමය ඉතාම ලැජ්ජා සහගත මැතිවරණ ක්‍රමයක්. මැතිවරණ ක්‍රමයෙන් හැම ගමකටම ගම නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලැබීම පිළිබදව වගේ ම ඒ මන්ත්‍රීවරුන් පැහැදිලි ක්‍රමයකට පත් කර ගත්තා නම් මේ මැතිවරණ ක්‍රමය වටිනවා. මේ රජයේ තිබෙන නොහැකියාව ප්‍රදර්ශනය කරපු පළමු වෙනි අවස්ථාවක් විදියට මෙය දකිනවා. ඒ වගේම අපගේ බලවත් කණාගාටුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බලවත් කණාගාටුව මේ වෙලාවේ පළමුවෙන්ම ප්‍රකාශ කර සිටිනවා. ඒ නිසා උගත් බුද්ධිමත් පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා කිසිම කෙනෙක් මේ මැතිවරණ ක්‍රමය ගැන සතුටු වෙන්නෙ නැහැ. එක අතකින් අපි සතුටු වෙනවා ගමකට එක මන්ත්‍රීවරයෙක් හෝ ලබාගන්න හැකි වීම පිළිබදව අනෙත් අතින් ඉතාම දුර්වල තත්වයක්.

ඒ වගේම මේ රට ඉතා දීර්ඝ සංවර්ධනයක් කරා ගෙන ගියපු හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එදා එරෙහි වුනු මිනිස්සු සියළු දෙනාම නැවත එකතු වෙමින් ඒ සදහා සියළු දෙනාම පෙල ගැසෙමින් ඉන්න අවස්ථාවක නාගොඩ ප්‍රාදේශීය සභාවේ මේ නෙලී මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා දැන් වීරි ලාම්පු අප සියළු දෙනාම දැන් බෙදා ගෙන කන්න ඕන කියලා. මේ 27 ක් නඩත්තු කරන්න ගියාම මම හිතන්නේ වීරි ලාම්පුවක්වත් ලබා ගන්න පුළුවන්ද යන ගැටළුව අපට තියෙනවා. ඒ නිසා මේ වගේ ලොකු අර්බුධකාරී තත්වයක් තුළ තමයි මේ ප්‍රාදේශීය සභාව තියෙන්නෙ.

අද අපි සියළු දෙනාම රැස්වෙලා සතුටු වෙනවා. මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කිරීමට වරම් ලැබීම ගැන. ඒ නිසා මේ වෙලාවේ අතිගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාව ඉතාම කෘතඥව සිහිපත් කරනවා. ඒ වගේම දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියකට අත ගසන්න ඔප නංවමින් ක්‍රියාත්මක වන ඒ දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමා මම මේ වෙලාවෙ ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම දකුණු පළාත් සභාවේ අභිනව සභාපති චමිලි විතානාච්චි මැතිතුමාත් අපට මේ සදහා නායකත්වය ලබා දෙමින් සහ දකුණු පළාත් සභාවේ අපේ ඉසුරු දොඩංගොඩ මැතිතුමා සහයෝගය දක්වමින් කල මෙහෙවර මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ වගේම මතක් කරනවා අපි 15 දෙනෙක් මෙතන වාඩිවුනාම අපිත් එක්ක තරග කරපු අපි වාගේම 13 ක් එළියෙ ඉන්නවා. අපි වෙනුවෙන් කතා කරපු මැතිවරණයට අදව් කල පිරිසක් එළියෙ ඉන්නවා. ඒ පිරිසද ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ජාතික ලැයිස්තුවේ පිරිසද ඉතා කෘතඥව සිහිපත් කරනවා.
අපේ සභාපතිතුමා නාගොඩවිතාන මැතිතුමත් මම මීට පෙරත් සභාව නියෝජනය කල කාලයේ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළා. ඒ වගේම එතුමන් මේ තනතුරට පත්වීම පිළිබදව අපි

ඉතාමත් සතුටු වෙනවා. ඒ වගේම මෙම ප්‍රාදේශීය සභාවේ නම නාගොඩ වුනාට මෙම නාගොඩ ප්‍රදේශය දිහා බැලුවම අපට සතුටු වෙන්න බැහැ. අපේ මේ සභාපතිතුමාට ලොකු වගකීමක් තියෙනවා. ඒ වගේම එතුමාගේ පරම්පරාවේ අයත් මේ ප්‍රාදේශීය සභාව ගම් සභාව නියෝජනය කරලා ඒ උරුමයෙන් එන්නේ. ඒ නිසා එතුමනට සිහිපත් කරනවා නාගොඩ මංසන්ධිය තාමත් පරණ තත්වයේ පවතින බැවින් සාමාන්‍යයෙන් 7.00 විතර වෙනකොට ගවයන් විශාල ප්‍රමාණයක් නිදාගෙන ඉන්න දර්ශනයක් තමයි අපට නාගොඩින් පේන්නේ. ඒ නිසා මේ පිළිබඳව සැළකිල්ලක් දක්වන්න. අපි 15 දෙනාම අපේ ගරු සභාපතිතුමා හා උප සභාපතිතුමා සමග නොබියව ඉදිරියට යන්න ඉන්නවා කියලා ප්‍රකාශ කර සිටිමින් ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලබා දෙමින් මේ ප්‍රාදේශීය සාභාව දකුණෙන් විතරක් නොවෙයි ලංකාවෙන්ම හොඳම සභාව බට පත් කර ගැනීමට උත්සාහ කරමු යන්න සිහිපත් කරමින් ඒ වගේම මම උඩවැලිවිටිය කොට්ඨාශය නියෝජනය කරමින් මට දිගටම මේ තත්වයේ ඉන්න පුළුවන් ඒ නිසා උඩවැලිවිටිය ජනතාව පක්ෂ භේදයකින් තොරව විශේෂයෙන් සිහිපත් කරනවා. මම ඇත්තටම ගරු කරනවා හිටපු සභාපති අජිත් එඩේරආරච්චි මැතිතුමන්ට එතුමාගේ කාලයේ මම එතුමන් සමග එකතු වෙලා 2007 වර්ෂයේදී ලක්ෂ 200 ක පමණ වැඩ කොටසක් උඩවැලිවිටිය කොට්ඨාශයට කරන්නට අවකාශ ලබා ගත්තා. අපි හැමෝම එකතු වෙලා මේ ගමන යමු. මම බලාපොරොත්තු වුනේ අවසානයේ කතා කරන්න නමුත් ගරු සභාපතිතුමාගේ විධානයෙන් මම ඒ කතාව සිදු කළා. අපි ලේකම්තුමිය ගැනත් ප්‍රශංසනීයව කතා කළ යුතුයි. එතුමිය හෙට අනිද්දා මා සමග පාරක් සම්බන්දව නඩුවකට යන්නත් තියෙනවා. අද සභාවෙ වුනත් අපට එකග වෙන්න බැරි වුනත් නීති රීති වලට අනුව කටයුතු කරලා තිබුනා.සභාවේ විශාල අඩුපාඩු රාශියක් තියෙනවා. අපි සභාවේ මේ වෙලාවේ පැවති සම්පත් පිළිබදව හා නිලධාරී හිගය පිළිබදව සළකා බලා කටයුතු කිරීමට අප සැමගේ ශක්තිය ලබා දෙනවා. උඩවැලිවිටිය නියෝජනය කරමින් මේ සභාවට පැමිණි ඉනෝකා නෙරංජලී විජේවර්ධන අජිත් එක්ක මැතිවරණයට ඉදිරිපත් වුනා. ඒ වගේම මාත් එක්ක දහම් පාසලේ ඉගැන්නුවා . අපි ගමේ එකට කටයුතු කළා. ඇය ප්‍රාදේශීය සභාවට පත්වීම පිළිබදව ෂතුටු වෙනවා. අපට එකතු වෙලා යම් වැඩකොටසක් උඩවැලිවිටිය ප්‍රදේශයට කරන්න පුළුවන්. ඇයටත් සුභාෂිංසන ගෙන එමින් නැවතත් උඩවැලිවිටය විහාරස්ථාන හතරෙහි ස්වාමින්වහන්සේලා ඇතුළුව සියළුම උඩවැලිවිටිය ජනතාවට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ උප සභාපතිතුමා ආදර්ශමත් මන්ත්‍රීවරයෙක් .එතුමා අපට විශාල ශක්තියක්. එතුමාගේ පරිණත භාවය අපි සිහිපත් කරනවා. අපි දන්නේ නැහැ අද මොනවා වෙයිද කියලා අපි දැනටමත් අර්බුධයක් නිර්මාණය කරලා තියෙනවා. ඒ හරහා අපි ආණ්ඩුව පෙරලනවා. ඒක දැනටමත් ජයග්‍රහණය කරලා තියෙන්නේ . අපි ඉතාම ඉක්මනට ඔබතුමාගේ නායකත්වය යටතේ රාජ්‍යයක් බිහි කර ගෙන රට සංවර්ධන කරන්න බලාපොරොත්තු වන බව පවසමින් මගේ කතාව අවසන් කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා**

ගරු සභාපතිතුමන්ගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. නාගොඩ ප්‍රාදේශීය සභාවේ 1991 සිට දෙපාරක් මම මේ සභාව නියෝජනය කළා. අජිත් එඩේරආරච්චි මැතිතුමා සහ චනන්ද්‍රා සහබන්දු මැතිතුමන් අජිත් එක්ක දේශපාලනය කළා. ඒ වගේම අවුරුදු 20 කට පසුව තමයි මම දේශපාලනයට ආවෙ. මම ආවෙ මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ මතය ජයග්‍රහනය කිරීමට. ඒ වගේම ප්‍රධාන සංවිධායක සම්පත් අතුකොරල මැතිතුමාත්, එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් අජිත් ගමගේ මහතා තමයි මම මේ දේශපාලනයට ගෙනාවේ. මම උනන්විටිය 13 කොට්ඨාශයෙන්

පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කරවීමට කටයුතු කළා. පක්ෂ භේදයකින් තොරව මට උර දුන් සියළු දෙනාටම මම මේ අවස්ථාවේ ස්තූතිය පළ කරනවා. ඒ වගේම මට මතකයි මේ ගරු සභාවට මම යෝජනා කළා, අපේ සභාව තුලවත් ප්ලාස්ටික් භාවිතය අවම කිරීම පිළිබඳව පොලිතීන් කවර සීමා කර කඩදාසි බෑග් භාවිතා කිරීමට යෝජනා කළා. අද පොලිතීන් විශාල වසංගතයක් බවට පත්වෙලා තියෙනවා. ඩෙංගු උවදුර පැතිරෙන්න විශාල හේතුව ඒක තමයි. එදා ඉදලා අවුරුදු 20 ක් පුරාවට අපට තේරිලා මෙහි විනාශකාරී බව .ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාවට ආදායමක් වශයෙන් ගමේ අය එකතු වෙලා යෝජනා කළා සති පොළක් නිර්මාණයකිරීම ගැන නමුත් අද වන විට එය අභාවයට ගිහින් තියෙනවා. මම සභාවෙන් ඉල්ලා සිටිනවා එම පොළ වැඩ ආදායමක් ලැබෙන විදියට නඩත්තු කරන්න කියලා. මේ වෙලාවේදී මම විජේපාල මැතිතුමා සිහිපත් කරනවා. අපි විශාල ශ්‍රමයක් කැප කරලා තමයි ඒ සති පොල අපේ ගමට හදා ගත්තේ. අද නඩුවක් මගින් පොළ භූමියේ කොටසක් අපට අහිමි වෙලා තියෙනවා. එය නැවත් ලබා ගැනීමට කටයුතු කරන්න කියලා ල්ලා සිටිනවා. පොල භූමිය පවරා ගන්න පුළුවන් කියන අදහස මට තියෙනවා. ඒ පිලිබඳව ඉල්ලා සිටිමින් මම නිහඬවෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයෙන්ද අවසරයි.

පළමුවෙන්ම මම අපේ ගරු සභාපතිතුමන්ට උනුසුම් සුභ පැතුම් එක් කරනවා. පරණතානායම්ගොඩ අංක 03 කොට්ඨාශයෙන් එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්ද ඉල්ලපු මන්ත්‍රීතුමා හැටියට විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාට පසුව නාගොඩ ප්‍රදේශයට සභාපතිධුරයක් ලැබුනු මොහොත ඒ ගැන මම සතුටු වෙනවා. වැඩක් කරන්න තියෙන කාලයක් මම විශේෂයෙන්ම මතක් කරනවා. සභාපතිතුමනි, පරණතානායම්ගොඩ අංක 03 කොට්ඨාශයේ නියෝජිතවරයා හැටියට මට එක්සත් ජාතික පක්ෂයට වටිනා ඡන්දය පාවිච්චි කරමින් පක්ෂය පරාජය වුනත් යම් පිරිසක් මට ඡන්දය ලබා දුන්නා. මම මේ වෙලාවේ පරණතාවනායම්ගොඩ, පරණතානායම්ගොඩ, වාඩියකන්ද, ගොඩැල්ලවත්ත ඇතුළු සියළුම ජනතාව ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. නාගොඩ ප්‍රාදේශීය සභා කොට්ඨාශය තුල මට වැඩිම ප්‍රතිශතයක් ලබා දුන්නා. ඒ වගේම ආසන සංවිධායක දකුණු පළාත් ගරු මන්ත්‍රී සුනිල් සේනානයක මැතිතුමන් මම මේ වෙලාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා. අපේ කොට්ඨාශයේ මන්ත්‍රීවරු 03 ක් ඉන්නවා ධර්මසිරි ගනේවත්ත මැතිතුමා හා අරුණ ශාන්ති මන්ත්‍රීතුමියත්, ඒ නිසා ගමේ ජනතාවට යම්කිසි සේවයක් එකතවෙලා කරන්න පුළුවන් වේවි. සභාපතිතුමනි, මාපලගම නාගොඩ නගර දෙක ගත් විට අපි පසුගිය වසර දෙකක තුනක කාලයකට පෙර මම නාගොඩ ප්‍රාදේශීය සභාවේ නියෝජිතයෙක් ලෙස සහභාගි වුනා. අපි ඒ සභාවට ගරු අපේ හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා ඉන්න කාලයේ. අපේ සභාවේ ලේකම්තුමිය දැඩි උත්සාහයක් ගත්තා මාපලගම නගරයේ වැසිකිළි පද්ධතිය ගැන. එම අඩුපාඩුව පිළිබඳව ජනතාව දිගින් දිගටම සභාවට ඉදිරිපත් කලා ඒ ගැන. තාම අපට ස්ථිර විසඳුමක් ලබා ගැනීමට හැකියාව නැහැ. සභාපතිතුමනි නාගොඩ පෙර පාසලට ගොඩනැගිල්ලක් නැහැ. වෙනත් ස්ථානවල තමයි පෙර පාසල පවත්වන්නේ.තවත් දෙයක් තමයි. තල්ගස්වල සති පොල මේ වන විට යම් යම් අබලන් තත්වයේ පවතිනවා. මේ අවස්ථාවේ පිලියෙල කල යුතු ස්ථානයක් ඒක. තවද, ලොකු ආදායමක් සභාවට ලැබෙනවා බදාදා ෂති පොලෙන්. 2015 ජනවාරි 08 වෙනිදා මේ රට තුළ ඇති වූ දේශපාලන පරිවර්ථනයත් එක්ක අද මේ රටේ සෑම කෙනෙකුටම තමන්ගේ

අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ප්‍රකාශ කිරීමේ අයිතිය ලැබිල තියෙනවා යුක්තිගරුක නීති ගරුක සමාජයක් ගොඩ නැගෙමින් පවතිනවා විවිධ අදහස් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශයට පත් කළා. නමුත් අපේ එක්සත් ජාතික පක්ෂ නායක ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්, වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් මේ දැවන්ත අරගලයට කැපවීමක් කළා. එහි ප්‍රතිඵල හැටියට අද අපි ඔබ තමුන්නාන්සේලාට පසුගිය මැතිවරණ දිහා බැලුවහම ඉතා සාධාරණ මැතිවරණයකට මුහුණ දෙන්න හැකියාව ලැබුනා. හොද වටපිටාවක් රට තුළ ගොඩනැගෙමින් තියෙනවා. විවධ මන්ත්‍රීවරු විවිධ අදහස් පැවසුවා. කමක් නැහැ. අද අපට ඒ නිදහස තියෙනවා කතා කරන්න. එදා වගේ සුදු වෑන් නලින් උස්සන් යන්නේ නැහැ. සභාවෙන් එළියට යනකොට ගහලා අරගෙන යන්නෙ නැහැ. මේ හොද පැත්ත තිබුනත් අපට චෝදනා එල්ල වෙමින් තියෙනවා. ඕනවට වඩා හොද කරන්න හොද නැති නිසා.

මිනිසුන්ට මේ තියෙන සාමකාමී වාතාවරණය තේරුම් ගැනීමට නොහැකි නිසාදෝ මන්දා අපට පසුගිය මැතිවරණයේදී යම් මට්ටමක පසුබෑමකට ලක්වෙලා තිබුණා. නමුත් එය ඉදිරියේදී නිවැරදි වෙලා ආසන සංවිධායක සුනිල් සේනානායක මැතිතුමා සමග අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් අපි පසුගිය අවුරුදු තුන තුළ පසුගිය අවු 20 කට කරන්න බැරි වුන සංවර්ධනයක් කළා. ඉදිරියේදී අපේ අනෙක් මන්ත්‍රීවරු 07 දෙනෙක් ඉන්නවා අනෙක් මන්ත්‍රීවරුන් සමග කටයුතු කිරීමට හැකියාවක් ඇතැයි නැවත වරක් පරණතානායම්ගොඩ ජනතාවට ස්තූතිය පුදකරමින් නැවත්ත් අභිනව සභාපතිතුමාට සුභ පතමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

අභිනව ගරු සභාපතිතුමන්ගෙන්ද, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයෙන්ද මාධ්‍යවේදී මහතුන්ගෙන්ද අවසරයි. අපි ඇත්තටම සුභපැතුම් එකතු කරනවා. අපේ සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් ලෙස නාගොඩවිතාන මැතිතුමා සභාපතිවීම පිලිබදව විශේෂනේම අපේ උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා 2011 මෙම ප්‍රාදේශීය සභාවට පත්වුන වෙලාවෙ ඉදලා අපේ සභාපතිතුමා උප සභාපතිතුමා සමග කටයුතු කළා. ඒ වගේම එදා හිටපු සභාපතිවරුන් හා මන්ත්‍රීවරුන් අද මෙම සභාවෙ ඉන්නවා එම මන්ත්‍රීවරුන්ටත්, නවක මන්ත්‍රීවරුන්ටත්, මන්ත්‍රීවරියන්ටත් මම මගේ සුභ පැතුම් එක් කරනවා. 2011 මැතිවරණයේ මම විපක්ෂ නායක ලෙස පත් වුනත් මෙවර සමානුපාතික ඡන්ද කොට්ඨාශයේදී මම තරග කල කොට්ඨාශයෙන් අයින්වෙලා ගෝණදෙනිය හගරන්වල කොට්ඨාශයෙන් තමයි මම පත් වුනේ. තරග කරලා එම කොට්ඨාශය ජයගන්න අපහසු වුවත් අපේ හිටපු සභාපතිතුමාගේ පුත් ධනංජය විලේගේ මහතා එම අවස්ථාව ලබා ගත්තා. පැරදුනු මන්ත්‍රීවරු කිව්වොත් වැරදියි. සමාණුපාතික ක්‍රමය යටතේ හැකියාව තියෙනවා අනෙක් මන්ත්‍රීවරුන් ස්ථානගත කරන්න. එලෙස මන්ත්‍රීවරයෙක් හැටියට මට මේ ස්ථානයට ඊමට හැකි වුණා. පසුගිය වසර 2 මාස 10 ක කාලය තුළ මන්ත්‍රීවරුන් නොමැතිව මේ සභාව පවත්වා ගෙන යාමට කටයුතු කල ලේකම්තුමියටත්, ට්‍රැක්ටර් රියදුරාගේ සිට වැඩ/ක්ෂේත්‍ර කම්කරු දක්වාත් අනෙක් සියළුම නිලධාරීන්ටත් මම මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා. අපි සභාපතිතුමා ගැන කියනවනම් පසුගිය සභාවලදී එතුමා අපිත් එක්ක හරි තැන ඉදගත් මන්ත්‍රීතුමෙක් හැටියට තමයි අපි එතුමාට ගරු කරන්නේ. ඊට වඩා අපේ ඥාති සම්බන්ධතා තියෙනවා. එතුමා හරි දේ කරපු හරිතැන හිටපු මන්ත්‍රීවරයෙක්. එතුමා පසුගිය අයවැයවලදී ඡන්දය ප්‍රකාශ නොකර සිටියා. සමහර තැන්වලදී විරුද්ධව ඡන්දය දුන්නා නමත් මේ ක්‍රමයේද පක්ෂයක් නැහැ. අපි ස්තූතිවන්ත වෙන්න ඕන. සභාපතිතුමාටත් උප සභාපතිතුමාටත් ලේකම්තුමියටත් මන්ත්‍රීවරු රීතිවලට අනුව ස්ථාන ගත කරාට අපි රටේ නියෝජනය කරන පක්ෂයක් හැටියටත් මේ රටේ රජය තිබෙන්නේ

එක් පක්ෂයකට ප්‍රාදේශීය සභාව තියෙන්නේ තවත් පක්‍ෂයක පළාත් සභාව තියෙන්නේ තවත් පක්ෂයක අපි මේ තේරුම් අරන් කටයුතු කරන්න ඕන. නමුත් අපි මොනතරම් පම්පෝරි ගැහුවත් මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා අරවා කරන්නම්, මේවා කරන්නම් කීවට අපි දන්නවා ප්‍රාදේශීය සභාවේ ආදායම මොකද්ද කියලා. ඒ නිසා කාගෙත් සහයෝගය නැතිවුනොත් මේක කරගෙන යන්න බැහැ. 27 ක් නඩත්තු කරන එකම අභියෝගයක්. මේ පාදේශීය සභාව හරි විදියට කරනවනම් මේ පක්ෂයෙන් දෙන්න පුලුවන් සහයෝගය අපි මන්ත්‍රීවරු 07 ක් දෙනාගෙන්ම ලැබෙනවා. රජය විදියට අපි ඒ සහය ලබාදෙනවා.

අපි මේ රජය ආවට පස්සේ මේ අවුරුදු දෙක හමාර තුල කටයුතු කරපු ආකාරය අපේ හිනිදුම ආසනය නියෝජනය කරපු සමන් මන්ත්‍රීතුමා දන්නවා.ප්‍රතිපත්තිය නියොජනය කලත් බද්දේගම ආසනය නියෝජනය කරපු එතුමා මේ අවස්ථාවේදී අපි ගැනත් කිවුව. අපි කවදත් පක්ෂ භේදයක් බැලුවේ නෑ. අපි ගමේ දේවල් එකට එක්ව තමයි කලේ. ඉදිරියේදී අපි ජනතාව වෙනුවෙන් කරන වැඩ වලදී අපේ සහයෝගය උපරිමයෙන් ලබා දෙනව අපිත් එක්ක එදා ඉදලම පක්ෂ භේදයකින් තොරව වැඩ කල මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා. ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා මගේ පෞද්ගලික මිත්‍රයෙක් අපි සියළුම දෙනාගේ ශක්තිය අපේ සභාපතිතුමාටත් ලබා දෙනවා. ඒ ශක්තිය ලබා දීල නාගොඩ ප්‍රාදේශීය සභාවි නියෝජිතයින් ඉහලට ඔසවා තබන්න උපරිමයෙන් කටයුතු කරන බව පවසමින් විශේෂයෙන්ම ගිය ප්‍රාදේශීය සභාවට අපිත් එක්ක හිටපු අපේ ජයලත් සුමනසේකර මන්ත්‍රීතුමාට ඒ ස්ථානය නියෝජනය කරන්න නොහැකි වෙලා තියෙනවා.එතුමා ගැනත් මේ වේලාවෙ සිහිපත් කරමින් මේ අවස්ථාවට එන්න උදවු කරපු බද්දේගම ආසනයේ ප්‍රධාන සංවිධායක බන්දුලලාල් බණ්ඩාරිගොඩ මහතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒවගේම සුනිල් සේනානායක මහතා ඇතුළු අපේ අග්‍රාමාත්‍යවරයා මේ අවස්ථාවේ සිහිපත් කරමින් අද මේ සභාවට එක් වූ සියලු මන්ත්‍රීවරුන්ට සුභ පතමින් මට මේ අවස්ථාවට ඒමට උදවු කරපු ගෝණදෙනිය හා හගරන්වල ජනතාවට නැවත ස්තුති කරමින් මම නිහඩ වෙනවා.

## ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රා සහබන්දු මහතා

අභිනව ගරු සභාපති නාගොඩවිතාන මැතිතුමා, උප සභාපතිතුමාගෙන්ද, මන්ත්‍රී මඩුල්ලගෙන් අවසරයි. මම ඇත්ත වශයෙන්ම මේ වෙලාවේ දීර්ඝ වශයෙන් කතා කරන්නේ නැහැ. දේශපාලන කතාවකට නැඹුරු වෙන්නේ නැහැ. කතා කරන්න අපට තව අවුරුදු 04 ක් තියෙනවා. අද තමුන්නාන්සේලාට ඉතාම සතුටු දවසක්. අර මෙතුමා කිව්වා වගේ මෙතුමාගේ ලොකු සිහිනයක් තිබුණා. මම නාගොඩ පුද්ගලයෙක් හැටියට සභාපති වෙනවා කියලා. ඒ සිහිනය ජය ගත්තු මනුස්සයෙක් තමයි අපේ නාගොඩවිතාන මැතිතුමා. ඇත්ත වශයෙන්ම අපි ගොඩක් සතුටු වුණා. අනෙක් මන්ත්‍රීවරු කියන්නෙපා අපි අසතුටු වෙයි කියලා. නාගොඩවිතාන සභාපතිතුමා එක්ක අපි කාලයක් වැඩකලා. යුක්තියත් සාධාරනත්වයත් අපි එතුමා තුලින් දැක්කා. එහෙමනම් අපි හිතුවා ප්‍රතිපක්ෂයක් හැටියට වාඩිවෙන කොට සභාපති පුටුවට ගැලපෙන්නෙ ඔබතුමා කියලා. ඒ නිසා තමුන්නාන්සේට මම ඒ ගෞරවය පුද කරනවා. ඒමෙන්ම මෙතන කියවුනා පරාජය කියන වචනය අපි පරාජය තුලින් ජයග්‍රහණය කල පිරිසක් වේවි. පරාජය වෙච්ච එක අපට උරුම වුන දෙයක්. තව අවුරුදු 04 කින් ඒක ඔබතුමන්ලාට වෙන්න පුළුවන්. ඒක අමතක කරලා වැඩ කරොත් තමුන්නාසේලා ඒ උද්දාමයෙන් පරාජය වෙනවා. ඒ නිසා මම හිතනවා ඒ පවතින ක්‍රමය තුළ අද ආණ්ඩුව දිහා බලන්න. ජනතාව ප්‍රතික්ෂේප කරපු මැති ඇමතිවරු රැසක් ඉන්න නිසා තමයි මේ ආණ්ඩුවට මේ කොඩිවිනය සිදු වෙලා තියෙන්නේ. ඒ ක්‍රමය අපි හරි කියන්නෙ නැ. මේක වෙනස් විය යුතුයි. නමුත් ඉතිහාසය මම වචන දෙකක් මතක් කරනවා. ඉතිහාසයේ මේ ප්‍රාදේශීය සභාව

ගමට හඳුන්වලා දුන්නේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා . එතුමා නැත්නම් අප එකතුවෙලා සාකච්ඡා කරලා ගම දියුණු කරන වැඩපිළිවෙලක් තිබුනේ නැහැ. ඒක නිසා මේක සංශෝධනය කරලා ඒ පැත්තට මේ පැත්තට පෙරලිලා ගම දියුණු කරන්න 27 දෙනෙක් ඇවිත් ඉන්නවා. එදා හිටියෙ 13 දෙනයි. අපි අනුමත කරන් නෑ එදා 13 යි. අද 27යි. ගමට බනිස් ගෙඩි බෙදුවත් අද ගමට බනිස් ගෙඩි 27 ක් ලැබෙනවා. එක පැත්තකින් ඒක සතුටට කාරණයක්. සභාපතිතුමනි මම අද මේ කිව්වයි කියලා හිතාගන්න තමුන්නාන්සේලාට අපේ සභය පතන්න වෙනවා. මම අත්දැකීම මත කතා කරන්නෙ. මේක මෙහෙම ගියත් මාසයක් දෙකක් අවුරුද්දක් යන විට ගරු සභාපතිතුමාට එන දේවල් මම දැන් කියන් නෑ. ඒ වෙලාවට අපට විපක්ෂයක් ලෙස කතා කරලා කියන්න පුලුවන් මට මේ වෙලාවෙ සහයෝගය ඕන කියලා. ඒක නිසා මේක බෙදා වෙන් කරන්න එපා. මේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙන් බිහිවුනු පාර්ලිමේන්තු මැති ඇමතිවරු ඉන්නවා. දකුණු පළාත් සභාවේ අමාත්‍යවරු ඉන්නවා. කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි, පුංචි අත්වැරුද්දක් ඔබට වෙලා තියෙනවා. විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා අපට අමතක කරන්න බැහැ. මේ ආරාධනා පත්‍රය දැක්කම මට පුදුම හිතුනා. ඇයි දෙයියනේ මේ මිනිසුන්ට ආරාධනාවක් නැත්තෙ කියලා. මම දන්නෙ නැහැ තත්වෙ මොකද්ද කියලා. ඒ වගෙම මම කණගාටු වෙනවා සම්බන්ධීකරණ කමිටුවේ සංවර්ධනය සම්බන්ධව මේ ප්‍රාදේශීය සභාවේ 27 දෙනාටත් යම් ප්‍රතිපාදනයක් ලැබෙනවා නම් අපි ලබා ගන්න වෙනවා. සංවර්ධන කමිටුවේ සම සභාපති වන පියසේන ගමගේ මැතිතුමා නිකම්ම අමතක කරන්න බෑ. හිටපු අමාත්‍යවරයෙක් අද පාර්ලිමේන්තුව නියෝජනය කරන අමාත්‍ය වරයෙක් ඒ වගේම හිනිදුම ආසනය සංවිධානය කරන දකුණු පළාත් සභා මන්ත්‍රී සුනිල් සේනානායක මහත්මයා ඒ වගේ අමතක කරන්න බැරි චරිත ටිකක්.මේක යටත්වෙලා තියෙන්නේ දකුණු පළාත් සභාවට එම නිසා විශේෂයෙන්ම දකුණු පළාත් සභා මහ ඇමතිතුමාට ආරාධනයක් තිබිය යුතුයි. මේවා අඩු පාඩු වෙන්න පුලුවන් නවක සභාපතිවරයෙක් ලෙස ඔබතුමාව නොමග යැව්වද දන්නෙ නැහැ.මම චෝදනාවක් නෙවෙයි කරන්නේ නිතරම දේශපාලනය කරපින්න ගන්න එපා.අපට පරාජයත් හුරුයි. ජයග්‍රහණයත් හුරුයි. මේ තුල ගමන යන හැටිත් අපි දන්නවා.අපි තමුන්නාන්සේලාට අවුරුදු 04 ක දීර්ඝ ගමනක් යන්න තියෙනව.අපි සෑහීමකට පත් වුනේ නෑ. අර අවුරුදු 02ක් තුල මෙතන ජනතා නියොජිතයකු නැති අඩු පාඩුව අපි දැක්ක. මට කණගාටුවක් තියෙනව මේ වෙලාවේ මම හිටපු සභාපතිවරයකු හැටියට එදා මට මීට අවුරුද්දකට උඩදි මගේ නිවසට යන පාර ප්‍රාදේශීය සභාව සතු පාරක්. මට සිද්ධ වුනා කොමසාරිස් තුමියට කථා කරල පාර සුද්ධ කර ගන්න.එවැනි යුගයක අපි හිටියේ. අපි අද සතුටු වෙනව මහජන නියෝජිතයෝ පිරිසක් අද අපිට ඉන්නව. හිටපු මන්ත්‍රීවරයකු හිටපු සභා පතිවරයකු වෙන්න පුලුවන් ඒ පිලි ගැනීම මේ සභාවේ එදා තිබුනෙ නෑ.පාලනයක් තිබුනෙ නෑ.මේ සියලු දේ දිහා බැලුවහම අපි නාගොඩ විතාන සභාපතිවරය ගැන සතුටු වෙනව.අනාගතයේදි අපිට ගොඩක් දේවල් කථා කරන්න තියෙනව,එහෙම නම් පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම අදහස් හා යෝජනා අරගෙන ගම දියුණු කරමු. රට සංවර්ධනය කරමු. පුංචි සිහිනයක් මම ඔබ තුමන්ලා ලග දැක්ක. අද කවුරුත් බලන් ඉන්නේ ආණ්ඩුව වෙනස් වෙයි කියල. නෑ ඒක සිහිනයක්.මේ ආණ්ඩුව රාත්‍රී 8 න් පසුව නෙමෙයි තව අවුරුදු දෙකහ මාරක් මේ රටේ අග්‍රාමාත්‍ය වරයා රනිල් වික්‍රමසිංහ කියලා ප්‍රකාශ කරමින් ඒ තුල අපි 27 දෙනාටම මේ ගමන එන්න සිද්ධ වෙනවා ප්‍රතිපාදන ලබා ගන්න සිද්ධ වෙනවා. කියන එකත් ප්‍රකාශ කරමින් අපි සැමට ජය පතමින් මා නිහඬ වෙනවා.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා කථා කරමින්**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුනි ,ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් හා ජනමාධ්‍ය වේදී සියලුම දෙනාගෙන් අවසරයි. අද දින අභිනවයෙන් සභාපති ලෙස පත් වූ නිමල් වික්ටර් නාගොඩවිතාන මැතිතුමනි, මම ඔබට සුභපතනවා මන්ත්‍රීවරයෙක් හැටියට නෙමෙයි සහෝදරයෙක් හැටියට, ලෙන්ගතු මිත්‍රයෙක් හැටියට සභාපතිවරයකු ලෙස ඔබ බොහෝම සුදුසු කෙනෙක්. මොකද මෙතන වාඩිවෙලා අපිත් එක්ක නියෝජනය කලේ, මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් කථා කලා.සමාජය වෙනුවෙන් කථා කලා. ඒ සභාපතිවරයාට විපක්ෂව කථා කලා. සභාපතිවරයාට පක්ෂව කථා කලා. ඒ නිසා මම ඔබට ගෞරව කරනවා.ඔබ මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුදු 16ක් ඉදල තමයි අද ඔතන වාඩිවෙලා මේ ප්‍රාදේශීය සභාවේ මුල් පුටුවට ඇවිල්ල සභාපතිවරයා හැටියට කියන්නේ එහෙනම් මගේ හෘදයාගම සුභ පැතුම නැවතත් එක් කරමින් ඒ වාගේම ලොකු කැප කිරීමක් කරල ආරවුලක් නැතිවෙන්න තමන්ගේ වචනය ආපස්සට අරගෙන මේකට සහයෝගය දුන් නියෝජ්‍ය සභාපති වුන ගාමිණි සුසන්ත මැතිතුමනි, ඔබටත් මම ගෞරව කරනව. ඒ වගේම මම සුභ පතනව. අද පත්වෙච්ච සියලුම මන්ත්‍රීවරුන්ට විශේෂයෙන්ම මගේ ගමේ විජිත් සහබන්දු මැතිතුමා, නෙලී වක්වැල්ල මැතිණිය ඒ සියලුම දෙනා ඇතුළු සියලුම නවක මන්ත්‍රීවරුන්ට අපේ ගෞරවය පුද කරනවා ඔබ සියලු දෙනාටම ලොකු ගමනක් යන්න ශක්තිය ලැබෙන්න කියල මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපේ හිටපු සභාපති චන්ද්‍ර සහබන්දු මහතා කියපු දේ ගැන මමත් එකග වෙනව.

ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු රැසක් මේ ප්‍රාදේශීය සභාව සම්බන්ධව ඉන්නවා. ඔවුන්ට ආරාධනා නොකිරීම සම්බන්ධව අපි කණගාටු වෙනවා. ඒක සම්ප්‍රදායක් ලෙස හිටපු හැම සභාපතිතුමෙක්ම සිදුකලා. නමුත් අද ඔබ අම්බලන්ගොඩ පැත්තට ගියා වගේ මට පේනව.ඒ තත්වයට පත්වෙන්න එපා ගරු සභාපතිතුමනි. ඔබටත් කොන්දක් තියෙනව මෙතන වාඩිවෙලා ඉන්න කොට ඔබට හොද ජවයක් තිබුන තමන්ගේ මතය ක්‍රියාත්මක කරන්න.අපි දන්නව ඔබේ හෘද සාක්ෂියට එකගව නෙවෙයි අද රැස්වීම තිබ්බේ. ඒක හොදින් අපි දන්න දෙයක්.මෙතන යම් දෙයක් කරපු හිටපු සභාපතිවරු ඔවුන්ට ආරාධනා කරන්න තිබුණ.ඔවුන් ආවත් නාවත් කමක් නෑ. අපි දේශපාලන මාතෘකාවකට එන්නේ නෑ. නැත්නම් අපේ ධනංජය විලේගේ මැතිතුමාට, අපේ ලක්රුවන් මන්ත්‍රීතුමන්ට උත්තර දෙන්න පුලුවන්. අපිට ඔබෙන් පොඩි ඉල්ලීමක් කරනව. මෙතන මන්ත්‍රීවරු 27 දෙනෙක් ඉන්නව ඔබ මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කාලේ අපි සභාපතිතුමාගේ කාමරේ වාඩිවෙන්න පොඩි ඉඩක් දුන්නේ නෑ. කවුරුවත් නැත්නම් විතරයි අපිට වාඩිවෙන්න පුලුවන්.ඒ වගේම උප සභාපති තුමාගේ කාමරේ අපිට වාඩිවේන්න පුලුවන් කමක් නෑ. අපි ඉන්න කාර්යාල නිලධාරීන් ඉස්සරහ නිළධාරී පුටු අරගෙන. ඒ නිළධාරීන්ට වැඩ කරන්න බැහැ. ඒ නිසා අපි කරුණාවෙන් ඔබෙන් ඉල්ලනවා මෙහි යම් ඉඩක් තියෙනව නම් පුංචි ඉඩකට පුටු 2ක් දාල මේ ඉන්න 27 දෙනාට ඇවිල්ල අභිමානයෙන් වාඩිවෙලා තමන්ගෙ ගමේ මනුස්සයෙකුට ඇවිල්ල කථා කරන්න පුලුවන් ලියුමක් ලියල දීල ඔවුන්ට මැදිහත් වෙන්න පුලුවන් විදිහේ කාමරයක් හදල දීල ඒ අවශ්‍යතාවය ඉෂ්ඨ සිද්ධ කරල දෙන්න කියලා කලින් සිටි සභාපතිවරුන්ගෙන් ඉල්ලුව. එතුමාලා දුන්නේ නෑ. අපි හිතනව ඔබ තුමාවත් ඒක කරයි කියල. මේ මන්ත්‍රීවරුන්ගේ අභිමානය ඇති කර ගැනීමට හැකිවන පරිදි එය ඉටු කර දෙන්න කියල ඉල්ලා සිටිනවා. ඔබ දන්නව ඔබ වීවී පහන් ගන්න ගිය හැටි. කසල බදුන් ගන්න ගියහම වෙච්ච ප්‍රශ්න මේකේ එහෙම නොවන්න කටයුතු කරයි කියල ලොකු බලාපොරොත්තුවක් තියෙනව.සභාපතිතුමනි, අපේ ආණ්ඩුව වට්ටන්න අපට ප්‍රශ්නයක් නෑ. හැබැයි ඒ ආණ්ඩුව වට්ටනකන් තමුන්නාන්සේට මොකක් හරි අමාත්‍යංශයකින් සහයෝගයක්වත් ඕන නම් අපි හරහා ඉල්ලන්න. අපි ඒක දෙන්නම්.ඔබ ජනතාව වෙනුවෙන් නම් සභාව වෙනුවෙන් නම් යම් දෙයක් ඉල්ලන්න අපි ඔබට ඒ දෙය දෙනවා. ඒ වගේම හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා අභාවප්‍රාප්ත වුනා. එතුමා මන්ත්‍රීවරයෙක්,විපක්ෂ නායකවරයෙක් ,උප සභාපතිවරයෙක්, හා සභාපතිවරයෙක් විදියට කරපු සේවාව මේ වේලාවේ සිහිපත් කරනව.අපි ඒ ගැන ශෝකය ප්‍රකාශ කරනවා. තවද අභවප්‍රාප්ත

වූ හිටපු මන්ත්‍රීවරයෙක්, විපක්ෂ නායක වරයෙක් හැටියටත් හදිසි මරණ පරීක්ෂක වරයෙක් හැටියටත් සිටි රංජිත් හේවාවිතාන මන්ත්‍රීතුමාවත් මේ වෙලාවේ සිහිපත් කරනව. නැවතත් සියලුම මන්ත්‍රී වරුන්ට සිංහල අවුරුද්ද වෙනුවෙන් සුභ පතමින් නිහඬ වෙනවා.

- **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා කථා කරමින්**

අපේ අභිනව ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඒ වගේම අපේ ජේෂ්ඨ මන්ත්‍රීවරුන්,මන්ත්‍රී වරියන්ගෙන් අවසරයි.ලේකම්තුමියගෙනුත් අවසරයි.අපි දේශපාලන අදහස් අද දිනයේ ප්‍රකාශ කරන්න අදහස් කරන්නේ නෑ.ප්‍රථමයෙන් අපට ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් බවට පත් වෙන්න මේ පවතින නව මැතිවරණ ක්‍රමය යටතේ ශක්තිය දීපු ප්‍රදේශයේ ජනතාවටත් අපේ ඉදිරිපත් වුනු අපේ සන්ධානයටත් අපේ ගෞරවයත් ස්තූතියත් මේ වේලාවේ පල කරනව. ඒ වගේම අපේ ගරු සභාපතිතුමන්ට අපේ පූර්ණ සහයෝගය හා ශක්තිය අඩුවකින් තොරව මේ සභාව පවත්වාගෙන යන්නට ලබා දෙනවා. අපි එක තීරණය කරල තියෙනව. අපි නැතත් කොට්ඨාශ 15 කට මන්ත්‍රීවරු 15 ක් ඉන්නවා. ඔබතුමා ඇතුලුව ශක්තිමත් පාලක පක්ෂයක් තියෙනව එයම ප්‍රමානවත් සභාව හොඳින් ගෙනියන්න. නමුත් ප්‍රතිපක්ෂ කණ්ඩායම් හැටියට අපිත් පූර්ණ සහයෝගය ලබා දෙනව. අද මම ගොඩක් සතුටු වෙනව මේ අභිනවයෙන් පත් වෙච්ච මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රී තුමියන්ලා දැකලා මොකද 1991 මේ ප්‍රාදේශීය සභාව මුල්න්ම පටන් ගත්තම පස්සේ දැන් අවුරුදු 27 කට වැඩි කාලයක් ගිහින් තියෙනවා. මේ ජ්‍යෙෂ්ඨ අය හැමදාම ප්‍රාදේශීය සභාවේ ඉන්න එකක් නෑ. ඒක නිසා අලුත් අය මේවාට ඉදිරිපත් වෙලා අවබෝධයක් ලබාගෙන මහජන සේවය සඳහා කැපවෙන්න අදිෂ්ඨාන කරගෙ ඒ වෙනුවෙන් තරග වැදිල ඉන් ජයග්‍රහණය කරල මේ අවස්ථාවට සම්බන්ධ වීම අපි ඉතා හොද සුභ කාරනයක් ලෙස දකිනව. ඒ නිසා ඒ සියලුම දෙනාටම තමන්ගේ දුරයේ කටයුතු තමන්ගේ වගකීම් තමන්ගේ කොට්ඨාශයේ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ඨ කර ගන්න පුලුවන් වසර 04 ක් බවට මේ වසර 04 පරිවර්තනය කර ගන්න ඒ ශක්තිය ලැබෙන්න කියල අපි ප්‍රාර්ථනා කරනව. මම ජේෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට නවක මන්ත්‍රීවරයන්ට කියනව ඔබ හැම අද ප්‍රාදේශීය සභාවට පත් වූයේ විශාල බලාපොරොත්තුවක් හිතේ තියාගෙන. විශාල බලාපොරොත්තු තියාගන්න. කොට්ඨාශයේ විශාල පරිවර්ථනයක් අපිට කරන්න පුලුවන් කියල ඒක කරන්න හැකියාව නැති වුනොත් මාස කිහිපයක් ඇතුලත පවතින තත්වය තුල කල කිරීමට සහ පසුබෑමට ලක්වෙනව. අපි හිතුව වගේ නෙමෙයි මෙතෙක් මුකුත් කරන්න බෑ කියල, ඒ ක්‍රම වේදය හදා ගන්න ඒ කොට්ඨාශ වලට වැඩ කරන්න තමුන්නාන්සේලා ශක්තසම්පන්නව තනි තනිවත් පොදුවේත ඒ අවස්ථාව සලසා ගන්න අද්ටන් කර ගන්න. අපි අද නිශ්ශබ්දව ඉදල ගෙදර ගියහම අපේ යෝජනාවක් ක්‍රියාත්මක කර ගන්න වෙන්නේ තවත් මාස තුනක් තිබිල.අපි මතක තබා ගන්න ඕන ක්‍රමවේදයක් තියෙනව ඉස්සෙල්ල න්‍යාය පත්‍රයට යොජනා ඉදිරිපත් කරනව පාරක් නම් සභාවේ යෝජනා සම්මත වුනොත් ඒ ගැන ඇස්තමේන්තු හදාගන්න ඕන.ඇස්තමේන්තුව එන්නේ ඊලග සභාවාරයේදී. එතකොට ගිවිසුම් අත්සන් කරල වැඩේ පටන් ගන්න වෙන්නේ ඊලග සභා වාරෙදියි.මුදල් ගෙවන්න වෙන්නේ ඊලග වාරෙදියි. කාලයක් යනව ඒ නිසා. මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනව අද න්‍යාය පත්‍රයටම මෙම යෝජනා දැමීමට නවක මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙන්න. මේ න්‍යාය පත්‍රයට පමණක් පළමු වතාව නිසා ඒ යෝජනාව ලිඛිතව තව දින දෙකක් තුනක් ඇතුලත සකස් කර ගේන්න.ඒ වගේම ඔබතුමන්ලා සම්බන්ධව හැම පඤියකින්ම දේශපාලන ඇමතිවරු පළාත් සභා ඇමතිවරු ඉන්නවා.එයාල ලගට ගිහින් කරදර කරල ඉල්ලල තමතමන්ගේ කොට්ඨාශ වල වැඩ කරන්න සල්ලි ටිකක් ඉල්ල ගන්න.වැඩ වලට ගන්න.ප්‍රාදේශීය සභාවට ඉල්ල ගන්න.සභාවෙන් පමනක් වැඩ කරන්න සල්ලි ගන්න අමාරුයි. එහෙම ගන්න සල්ලි සභාවෙ නෑ.අපි ඉතිහාසයේ කරපු වැඩ සියල්ලම මේ ප්‍රාදේශීය සභාවේ සල්ලි වලින් කරා නොවෙයි.මේ මන්ත්‍රී කම ලයිසන්

එකක් හැටියට ප්‍රාචිච්ච් කරල පිටින් සල්ලි ගෙනැල්ල නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කරලා.නැත්නම් රජයේ වෙනත් ආධාර අරගෙන ඒ ගම් වල වැඩ කරල තමයි අපි ප්‍රාදේශීය සභාවේ වැඩක් කියල මේක පෙන්නුවේ.එහෙම තමයි ඒ වැඩේ ගෞරවය ගත්තේ. ඒකෙන් සභාවත් අපිත් දෙගොල්ලම රැකුනා. මෙහේ ලොකු සල්ලියක් නෑ. සභාව අවුරුදු 03 ක් පැවතුනේ නැති නිසා දැන් පොදු අරමුදලේ ලක්ෂ 12 ක් තියෙනවා.ඒවා බිල් ගෙවන්න ඇත්තේ ඉතින් පොදු අරමුදලේ සල්ලි ටික මන්ත්‍රී පාලන තලයක් ඇතුලත ඉතාම සීඝ්‍රයෙන් ඉවර වෙනව ඒක තමයි අපි අත් දැකීමෙන් දන්න දේ.මේ ලක්ෂ 12 ඊලග මාසේ ලක්ෂ 06 බහියි. ඊලග මාසේ ලක්ෂ 2 ට බහියි. ඊලග මාසේ ඍණ අගයක් ගනියි. ඒක තමයි ඇත්ත.ඒකට හේතුව ඉල්ලීම වැඩියි යෝජනා වැඩියි. ලේකම්තුමිය යටතේ පාලනය තිබෙන කොට වියදම් කරන්න බයයි. අවසර ගන්න ඕන. කමිටු දාන්න ඕන. ඒ නිසා රාජ්‍ය නිළධාරිනියක් හැටියට ඒක ගිණුමේ තියාගෙන ඉන්නව. සභාපතිවරයෙක් කරන්නේ හෙට හිරේ ගියත් ඒ වැඩේ කරන්න උත්සාහ ගන්නවා. එතකොට එතුමටත් අධිභාර වලට එන්න සිද්ධ වෙනව. උප සභාපති ඇතුළු සියළුම මන්ත්‍රීවරු අධිභාර වලට පත් වෙනව.ඒ වුනත් ඒ දේ කරනව. සභාපතිවරු ආයතන වලට පවා ණය වෙලා වැඩ කරනව.මම මේව කියන්නේ සභාව හෑල්ලු කරන්න නෙමෙයි සල්ලි නෑ සභාවේ.ඒ නිසා මේ මත හැපිලවැඩ කර ගන්න බැරිවුනොත් සභාවෙ මිනිස්සු හිතයි ඔබල යැව්වෙ අපරාදේ කියල.ඒ තත්වය මග හරවා ගන්නත් සියලුදෙනාම හැකි ප්‍රමාණයෙන් කටයුතු කරන්න. මමත් මේ වෙන කොට ලක්ෂ 07 ක් ඒ කොට්ඨාශයේ ක්‍රීඩාංගන 2ක් සෑදීමට මහ ඇමතිතුමාගෙන් අරගෙන තියෙනවා. තමුන්නාන්සේලාත් ඒ වගේම කාගෙන් හරි ඉල්ලා ගන්න බලන්න.තමන්ගේ කොටසට වැඩ කරන්න. මම මගේ කොට්ඨාසය අලුත් වත්ත කොට්ඨාසය ගැන සතුටු වෙනව. 1991 ඉදල කිසිම දේශපාලන පක්ෂයකින් මා හැර වෙනත් දේශපාලඥ යෙක් කිසිම වර්ෂයක හිටියේ නෑ.මේ මැතිවරනේම තමයි අපේ කොට්ඨාශයේ තවත් මන්ත්‍රී වරයෙක් ලැබිච්ච අවස්ථාව. අපේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමෙක් විදුහල්පතිතුමෙක් ආදරණීය සහෝදරයෙක් චන්ද්‍රසිරි වනිගරත්න මැතිතුමා. ඒකත් මම ආඩම්බරයෙන් මතක් කරනව. දැන් කොට්ඨාසයකම දෙන්නෙක් ඉන්නවා. අපි එකතු වෙලා දැන් කොට්ඨාශ දියුණු කරන්න පුළුවන් ඒක විශාල ශක්තියක්. ඒකට පරණ අයත් එක්ක අපිට වැඩ කටයුතු කරන්න හැකි වීම ඇත්තටම ලොකු එකතුවක්. මම හිතුවෙ නෑ කවරදාකවත් මේ ප්‍රාදේශීය සභාවේදී එම් එම් දිසානායක මහතා හමුවේවි කියල. මම හිතුවා එතුමා දේශපාලනයට එන එකක් නෑ කියල නමුත් පැමිණීම විශාල ශක්තියක්. ඉතාම හොද මහත්මයෙක් හොද ජනතා නියෝජිතයෙක්.දිසානායක මහත්මයාගේත් ඥාතීන්. අපි හැමෝම උපරිම සහයෝගය නාගොඩ විතාන සභාපතිතුමාට ලබා දෙනවා. එතුමා නොදැන හෝ වැරදි ගමනක් යනවා නම් අපි ඒ ගමන වලක්වනවා. ඒවා නිවරදි කිරීම වෙනුවෙනුත් අපි පෙනී ඉන්නව.සභාවේ සම්පත් භාවිත කරමින් සභාවේ කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කිරීම අවශ්‍යයි. ඒ නිසා තමයි අපි වාහන වල ඉන්දන අනුමත කලේ. ජනතාවට වැඩක් තියෙන දේ කරන්න. මේ මැතිවරණ ක්‍රමය යටතේ මේ සභාවට පත් වෙන්න අවශ්‍යම මන්ත්‍රීවරුන්ට මේකට එන්න බැරි වුනා.මෙකෙන් වැඩියෙන්ම අමාරුවෙ වැටුනේ එක්සත් ජාතික පක්ෂය .ජේෂ්ඨ මන්ත්‍රීවරු 10 ක් ලයිස්තුවේ ඉන්නව. පත්කරගන්න බැරිවුනා.ගොඩක් ජේෂ්ඨයෝ ,විශේෂයෙන්ම සෙනෙවිරත්න මහතා, සරත් ගනේවත්ත මහතා, ජයලත් මහතා, රංජිත් මහතා යන මන්ත්‍රීවරු පත් කරගන්න බැරි වුනා. ඒ නිසා විශාල ධාරිතාවක් තියෙන ඒ මන්ත්‍රීවරු ගෙදර ඉන්දෙද්දි ඔබලා ඇවිල්ල ඉන්නව.ඒ නිසා ඒ වැඩ කොටස ඔබ සියළු දෙනාම කරන්න වෙනව.ඒ කාර්ය භාරය ඒ ජනතාව වෙනුවෙන් ඒ පක්ෂ වෙනුවෙන් කරන්න. ඒ පිළිබද වගකීමක් ඔබතුමන්ලට තියෙනවා. ඒක කරන්න කියල අපි ආරාධනා කරනව. අපේ පක්ෂෙ ඉන්නේ මන්ත්‍රීවරු 03 දෙනයි. තුන්දෙනාගෙනුත් අනිත් මන්ත්‍රීතුමා දැන් ඇත්තෙත් නෑ. ජනතා විමුක්ති පෙරමුණ එකයි.මම සතුටු වෙනව. මේ ප්‍රාදේශීය සභාව එම් එස් අමරසිරි වැනි වැනි ආණ්ඩුකාර වරු පහළ වෙච්ච සභාවක්, මලාමුරේ කලු මහත්තය, ඉලේපෙරුම මහත්තයල, ආරියතිලක මහත්තයලගේ තාත්තල වගේ පරණ අය බිහි වෙච්ච ඓතිහාසික සභාවක් මේක. අද

පාර්ලිමේන්තු ඇමතිවරු මන්ත්‍රීවරු බිහි වෙච්ච සභාවක් මේක ලංකාවේ ඓතිහාසික වටනාකමක් තිබෙන සභාවක් මේක.ඒක නිසා මෙක හෑල්ලු වෙන්න දෙන්න එපා ඒ වගේම මම මේ වේලාවේ සිහිපත් කරනවා හිටපු සභපති ගරු හේමචන්ද්‍ර විලේගේ මැතිතුමාත් හිටපු මන්ත්‍රීත් රංජිත් හේවා විතාන මන්ත්‍රීතුමාත් එතුමන්ලා හදිසියේ අභවප්‍රාප්ත වුනා. ඒ පළිබඳව ශෝකය පළ කරනව.කල මෙහෙවරත් සිහිපත් කරනව.සතුටකුත් තියනව හේමචන්ද්‍ර විලේගේ මැතිතුමාගේ පුත් ධනංජය විලේගේ මහත්මය වගේ තරුණ අය දේශපාළනයට ඇවිත් තියෙනව.ඡන්ද 61% ක නියෝජනයක් කරමින් වේරංග ලක්මාල් වැනි තරුණ අය අපේ සහෝදරයෝ අපට ආඩම්බරයක් මොන දේශපාලන පක්ෂ නියෝජනය කලත් ඒ මතය දරණ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්න මේ ඡන්ද වරම මෙහෙයවන්න කටයුතු කරන්න කියල අපි ආරාධනා කරනව.කාගේවත් අතකොලු බවට පත් නොවී කොතලාවල කොට්ඨාශය තමයි මේ බල ප්‍රදේශයේ අන්තිම කොන ඒ කොට්ඨාශයේ තමයි මේ සමන් විතානගේ මන්ත්‍රීතුමත් පත් වුනේ අන්තිම දුෂ්කරයි ඇස නොගැටිච්ච ප්‍රදේශයක් දැන් ඒ කොටසට වැඩ කරන්න පුළුවන්.අපේ විජිත් සහබන්දු මැතිතුමා තුන් පාරක් මේ මැතිවරණ ක්‍රමයට ඇතුලත් වුනා ඒත් සටන අත හැරියේ නෑ.ඔහු ජයග්‍රහණය කළා.හැමෝම මේ සටන අත හරින්නේ නැතුව ඉදිරියට කරගෙන ආව.අපේ ගාමිණි සුසන්ත මන්ත්‍රීතුමා අතිශයින් සුදුසුකම් තියෙනව.රණ්ඩු සරුවල් වුනේ නෑ. නමුත් මෙතුමා නාගොඩ විතාන මහත්මයාට ඉහල සහයෝගයක් දෙමින් ජේෂ්ඨ කෙනෙක් හැටියට උපදෙස් දෙමින් එතුමා 1997 පත්වුනේ.ජේෂ්ඨයෙක් හැටියට තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටුකරමින් කරන මේ දේ ඉතාම හොද මහත්මා ගුණයක්.වෙන අය කරන්නේ කකුලෙන් අදින එක මේ පරපුරට ආදර්ශයක් දීමක් හැටියට තමයි මම දකින්නේ.අපි මේ පාර සභාවේ නවක මන්ත්‍රීවරු ඉන්න නිසා විනය කියන එකට පළමු තැන දීල තමයි කටයුතු කරන්න ඉන්නෙ. අපට ඡන්දය දුන් මිනිසු න්ටත් පක්‍ෂයටත් ඒ සියළු දෙනාටත් මේ කාලය ඉතා හොද කාලයක් වේවා.නාගොඩ ප්‍රදේශයේ ඉතාම ප්‍රබුද්ධ,ඉතාම ගුණකරුක,ඉතාම කීර්තිමත් මහා විශාල ඥාති පරපුරකට සම්බන්ද අපේ බාල මහත්තයගේ පුතා මේ වෙලාවේ නාගොඩ සභාවේ සභාපති බවට පත්වෙලා තියෙනව.නාගොඩවිතාන මැතිතුමා නාගොඩට ආශිර්වාදයක් වන පවුලක් ඒ පවුලේ ගෞරවයත් තාත්තාගේ ගෞරවයත් සහෝදරයින්ගේ හා ඥාතීන්ගේ ගෞරවයත් පරපුරේ ගෞරවයත් ආරක්ෂා කරමින් සභාව විධිමත්ව පාලනය කරමින් මේ සභාව සභා අතරේ ඉතාම හොද සභාවක් බවට පත් කරන්න ඔබතුමාට ශක්තිය ලැබේවායි පතමින් මම නිහඬ වෙනව.

**මූලාසන කථාව**

උප සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රී මඬුල්ලෙන් අවසරයි.අපේ සභාව විධිමත් විධියට පටන් ගන්න ඕන කියලා මම හිතනවා. අද බන්දුල මන්ත්‍රීමා ඇවිත් ගියා.එතුමාට කියන්න ඕන අනිත් දවසේ වෙලාවට එන්න කියල. අද මට හරි සතුටුයි අපේ මන්ත්‍රී වරු සියළු දෙනාම ජාතික ඇදුමින් සැරසී ඇවිත් සිටිය. මන්ත්‍රීවරියනුත් එහෙමයි අනෙක් දවසේ මන්ත්‍රීතුමියන් සුදු සාරියෙන් සැරසී එනවා නම් ගොඩක් වටිනවා. ඒ වගේම අපේ චන්ද්‍ර සහබන්දු මැතිතුමාත් නන්දන මැතිතුමාත් කිවුව වගේ අපේ ආරම්භක උත්සවය පිළිබදව හැම කෙනෙකුටම පෞද්ගලිකව දුරකථනයෙන් කථා කලා නමුත් ඔවුන් මාත් එක්ක තරහට නෙමෙයි විවිධ දේශපාලන හේතු නිසා අද සහභාගි නොවූ බව මම ප්‍රකාශ කරන්න ඕන මම හැමෝටම දුරකථනයෙන් කථා කලා. ඒ ගැන අහිතක් හිතන්න එපා. අපි ආරාධනා පත්‍රය හැදුවේ ආයතන වලට දීමට පමණක් බවත් ප්‍රකාශ කර සිටිනවා. අපි 2015 ජනවාරි 08 වෙනිදායින් පසුව මහින්ද මහතා වටා ඒකරාශී වෙලා අපි වෙනමම පක්ෂයක් පිහිටෙව්වා. මහින්ද මහත්තයාගේ ඇල්ම බැල්ම යටතේ තමයි අපි වෙනමම තරග කරල මෙවර කොට්ඨාස 15 ක් ජයග්‍රහණය කරල

බලය ලබා ගත්තේ හැබැයි මේක ජරා මැතිවරණ ක්‍රමයක් හුගක් සභා මේ ක්‍රමය යටතේ පටන් ගන්න බැරි වෙලා තියෙනවා. ඒකයි වර්තමාන තත්වය.ඇත්තටම අපි ඉස්සර මනාප ක්‍රමය යටතේ එකම පෝස්ටරයේ රූප 2ක් දාගෙන ඡන්දය ඉල්ලුවා. නමුත් මේ ක්‍රමය යටතේ ගමේ හිතවතුන් සහෝදර සහෝදරියන් එකිනෙකා රණ්ඩු වුනා. ඇත්තටම මේ අනෙක් පක්ෂවල මන්ත්‍රීවරු පරාජය වුනේ නෑ. මේ ඡන්ද ක්‍රමයේ තියෙන අඩුපාඩු තමයි ඒ.නමුත් අපි සතුටු වෙනව කාන්තා නියෝජනය ලැබීම පිළිබදව. මම නියම ශ්‍රී ලංකා පාක්ෂිකයෙක් මම මහින්දගේ විතරයි. ඒක මම ඕන වේලාවක ප්‍රකාශ කරනව ඒක එහෙමයි කියල මෙතන ඉන්න කිසි කෙනෙකුට මම අබ මල් රේණුවක වත් කරදරයක් කරන්නේ නෑ.මොකද මම මහින්ද මහත්තයට ආදරෙයි. මෙතුමා තිස් අවුරුදු යුද්දයක් ඉවර කරපු නිසා අපිට නිදහසේ කටයුතු කරන්න ඉඩ සලසපු නායකයා නිසා ඒ ප්‍රතිපත්තියේ මම ඉන්නව මම සභාපති තනතුරට ලෝභ නෑ. මම මේ හැන්දෙන් කාටත් එක වගේ බෙදනවා.එමෙන්ම ආදාහනාගාරයක් සෑදීම පිළිබදව කථා කලා මීට පෙර සියළු කලින් හිටි සභාපතිවරුන් ඉඩම් සොයා බලා තිබුනා. ඒක ඇත්තටම අවශ්‍ය දෙයක් විශාල මුදලකුත් ඕන. අපි ඔක්කොම එකතු වෙලා ඉදිරියට ඉඩමක් හොයා ගන්න බලමු කියල ප්‍රකාශ කර සිටිනවා.

ඒ වගේම පොළ සංවර්ධනය කිරීම මෙහිදී සාකච්චා වුනා. උනන්විටිය පොල,උඩුගම පොල,තල්ගස්වල පොල සංවර්ධනයටත් කටයුතු කරන බවත් ප්‍රකාශ විය. ඒ වගේම මාපලගම වැසිකිලි ප්‍රශ්නය ස්ථානයක් නොමැතී වීම ප්‍රශ්නයක් වුවත් මේ වන විට මාපලගම බස් ස්ටෑන්ඩ් එකේ සෑදීමට ඉදිරියේදී ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙනවා. ඒ වගේම පෙර පාසල නාගොඩ ප්‍රදේශයේ ඉදි කිරීම සදහා අපට සෙනෙවිරත්න මහතා ඉඩමක් ලබා දීමට එකග වී තිබෙනවා. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය මැදිහත් වීමෙන් එය අප හට දීමට එකග වුනා. හොද ලස්සන ආදර්ශමත් පෙර පාසලක් සෑදීමට අවශ්‍ය ගොඩනැගිල්ල පවරා දෙන ලෙස සෙනෙවිරත්න මහතා ප්‍රකාශ කර ඇත.

සංවර්ධනයේදී අපි උඩුගම නාගොඩ මාපලගම යන ස්ථාන තුනම ගැන සලකා බලනවා. නාගොඩ බල ප්‍රදේශයේ ඒ ඒ ස්ථාන ප්‍රදේශ වශයෙන් වෙන් කර අපි කටයුතු කරන්නේ නෑ. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕන මේ සභාවේ හිටපු සභාපති විලේගේ මැතිතුමා සහ හිටපු මන්ත්‍රී රංජිත් හේවා විතාරන මැතිතුමා එතුමන්ලා හදිසියේම අභවප්‍රාප්ත වඅනා.අපි ඒ ගැන බලවත් ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා ඒවගේම අද මෙතනට සහභාගි වූ සියළුම මන්ත්‍රීවරුන්ටත් මන්ත්‍රීවරියන්ටත් ලේකම් තුමියටත් අපේ ජනමාධ්‍ය වේදී හේමපාල මහතාටත් අපේ මංගල මහතාටත් ස්තුතිවන්ත වෙනවා. මම මාධ්‍යවේදී මහතුන්ට කියනවා අපේ සභාව තියන දවසට හැමදාම සහභාගි වෙන්න. අපේ හොද නරක රටට ලෝකයට ගෙනියන්නේ ඔබ තමයි. අද මාධ්‍ය බොහෝම විවෘත වෙලා තියෙනවා. අද මාධ්‍ය නිසා අපි වැරදි කලොත් ප්‍රශ්නයක් ඒ නිසා මාධ්‍ය අපිට හොද ශක්තියක් වෙලා තියෙනවා අපි ඒක නිසා මාධ්‍යට ගරු කරනවා. අද දින මංගල සභා වාරය අවසන් කරනවා. සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.

සභාපති

නාගොඩ ප්‍රාදේශීය සභාව

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                  දිනය :